# වාර්ෂික වාර්තාව

# 2020

## ජාතික යොවුන් සේනාංකය

ජීවන කුසලතා සංවර්ධනය කරනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය

# දැක්ම හා මෙහෙවර



## අපේ දැක්ම

ආසියානු කලාපය තුළ තාරුණ්‍යය සඳහා ජීවන කුසලතා සංවර්ධනය කරනු ලබන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

## අපේ මෙහෙවර

දැනුම, නිපුණතා හා කුසලතාවයන්ගෙන් පරිපූර්ණ විනයගරුක, අභියෝගයන්ට නොසැලෙන ජවසම්පන්න තාරුණ්‍යය, ජීවන කුසලතා සංවර්ධනය තුළින් ගොඩනැංවීම සහ වෘත්තීය නිපුණත්වයට අවැසි කුසලතාවන්හි හිඩැස පිරවීම තුළින් ශ්‍රී ලාංකේය තාරුණ්‍යය සංවර්ධනයට දායක වීම.



## අරමුණු

- යෞවන/යෞවනියන්ගේ ජීවන කුසලතා සහ පෞරුෂත්ව සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය ලබාදීම, වෘත්තීය පුහුණුව සහ රැකියා අවස්ථාවන්ට යොමු කිරීම



## ප්‍රධාන කාර්යයන්

- ජාතික යොවුන් සේනාංක පාඨමාලාව සඳහා රේන්ජර්වරුන්/වරියන් බඳවාගැනීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා බඳවාගැනීම.
- පාඨමාලාව නිසි පරිදි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ආයතනය තුළ ඇති භෞතික සම්පත් පරිපාලනය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- අභ්‍යන්තර පුහුණුලාභීන්/ලාභිනියන්ට අමතරව බාහිර පාර්ශ්වයන් සඳහා ජීවන කුසලතා පුහුණුව ලබාදීම.
- හෝටල් පාසල හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ පාඨමාලා පවත්වාගෙන යෑම.
- යෞවන/යෞවනියන්ගේ සෞඥර්යාත්මක හා ක්‍රීඩා කෞශල්‍යන් වැඩිදියුණු කිරීමට දායකත්වයක් සැපයීම.



# සභාපතිතුමාගේ පණිවුඩය

2020 වසර ශ්‍රී ලංකාවට අභියෝගාත්මක වසරක් වූයේ කොවිඩ්-19 වෛරසයේ පැතිරයාමත් සමඟ ඇතිවූ වසංගත තත්ත්වයේ බලපෑම නිසා ය. මෙවැනි වාතාවරණයකදී වුවද ජාතික යොවුන් සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ශක්තිමත්ව පවත්වාගෙන යෑමට හැකිවීම පිළිබඳව බෙහෙවින් සතුටු වෙමි.

දීප ව්‍යාප්ත ව සිටින යෞවන යෞවනියන් විනයෙන්, නායකත්වයෙන් හා මෘදු කුසලතාදියෙන් පිරිපුන් පුද්ගලයන් බවට පමුණුවමින්, ඔවුන් ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා කැප වුණ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වනුයේ, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික යොවුන් සේනාංකයයි. තිරසර සංවර්ධිත රටක් උදෙසා විනය, නායකත්වය සහ පෞරුෂත්වයෙන් යුත් සක්‍රීය නවෝත්පාදන තරුණ ප්‍රවාහයක් ගොඩනැගීමට දායක වීම ජාතික යොවුන් සේනාංකයේ ප්‍රමුඛ කාර්යයභාරය වී තිබේ. 2020 වර්ෂයේදී තරුණ සංවර්ධනය හා වෘත්තීය පුහුණුව අරමුණු කරගත් පුහුණු වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවා ඇති අතර මේ යටතේ ජීවන කුසලතා පුහුණු වැඩසටහන් 116 ක් ක්‍රියාත්මක කර තිබේ. ඒ අනුව මෙම වසරේදී පුහුණුව අවසන් කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව 13,396 කි. එසේම මෙම පුහුණුලාභීන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍රයක් ලබාදීමට සැලසුම් කර තිබේ. ලෝක වසංගතයක් අභිමුව වුවද පාසල් ශිෂ්‍ය නායක පුහුණු වැඩසටහන් 30 ක්, බහුකාර්ය සංවර්ධන කාර්යය සාධන බලකා වැඩසටහන් 105 ක්, ලිංගික සම්ප්‍රේෂණ රෝග (STD) වැළැක්වීමේ වැඩසටහන් 94 ක්, බෝ නොවන රෝග වැළැක්වීමේ වැඩසටහන් (NCD) 89 ක්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 91 ක්, පරිසරය සුරැකීමේ වැඩසටහන් 23 ක්, ක්‍රීඩා උලෙළ 18 ක්, විවාද තරඟ 91 ක්, රචනා තරඟ 93 ක්, දැනුම මිනුම තරඟ 88 ක්, ආපදා කළමනාකරණ වැඩසටහන් 67 ක්, ප්‍රජා සංවර්ධන වැඩසටහන් 67 ක් සහ විසිර යෑමේ උලෙළ 58 ක් පවත්වමින් ජාතික යොවුන් සේනාංක පුහුණුලාභී යෞවන යෞවනියන් අනාගත ලෝකය හා අත්වැල් බැඳ ගැනීමට අවැසි දැනුමින් සන්නද්ධ කිරීමට හැකිවීම සුවිශේෂී තත්ත්වයකි.

මූලික පුහුණුවෙන් පසු තමන් කැමති වෘත්තීය පුහුණුවක් සඳහා යොමුවීමට මඟපෙන්වීම ද ජාතික යොවුන් සේනාංකය මඟින් නිරතුරුව ක්‍රියාත්මක කරන වැඩසටහනක් වන අතර මෙම වසරේදී ද පුහුණුලාභීන් 1364 දෙනෙකු වෙත විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය කොට වෘත්තිය පුහුණුව ලබාදී තිබේ. ජාතික යොවුන් සේනාංකයේ අභ්‍යන්තර පුහුණු ලාභීන්/ලාභිනියන් 5001 දෙනෙකු සඳහා නාවුල පිහිටි බැහැරගත පුහුණු මධ්‍යස්ථානයේදී දීර්ඝ අභ්‍යාස පුහුණුවක් මඟින් ඔවුන්ගේ ආත්ම විශ්වාසය, කණ්ඩායම් හැඟීම, නායකත්වය දරා ගැනීමේ හැකියාව වැනි සුවිශේෂී මෘදු කුසලතා වර්ධනය සඳහා පියවර ගෙන ඇත.

රටක ගාමක බලවේගය ලෙස ගැනෙන තාරුණ්‍යයේ වගකීම දෙවුර මත තබමින් ජාතිය හමුවේ සිය යුතුකම සහ වගකීම නිසි ලෙස ඉටු කරන්නට රජයක් ලෙස මෙන්ම වගකිව යුතු පුරවැසියන් ලෙස අප බැඳී සිටින්නෙමු. ඒ සඳහා ඇති අභියෝග ජය ගනිමින්, අපි සක්‍රිය පෙරගමනක යෙදී සිටිමු. මේ නිපුණතා සංවර්ධන දශකයෙහි, මේ තාක් ලද දැනුම හා අත්දැකීම් රටේ තරුණ ජනයා ගේ ප්‍රගමනය උදෙසා කැපකිරීම ද අප ගේ ප්‍රමුඛ ඉලක්කය වෙයි. ජාතික යොවුන් සේනාංකය එහි ඉහළම තලය දක්වා ගෙන ඒමට ඔවුන්ගේ උපරිම දායකත්වය ලබාදීමට කටයුතු කරන ජාතික යොවුන් සේනාංකයේ කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**කර්නල් දර්ශන රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
සභාපති
ජාතික යොවුන් සේනාංකය



# අන්තර්ගතය


**දැක්ම**
**මෙහෙවර**
**අරමුණු සහ කාර්යයන්**
**සභාපතිතුමාගේ පණිවුඩය**
**හැඳින්වීම**

**1. ජාතික යොවුන් සේනාංකයේ පාලනය**
1.1 යොවුන් සේනාංක සභාව 02

**2. ආයතනික ව්‍යුහය**
2.1 අධ්‍යක්ෂ මණ්ඩලය 03-05
2.2 යොවුන් සේනාංක කාර්ය මණ්ඩල 06-07
2.3 සංවිධාන ව්‍යුහය 08

**3. පුහුණු මධ්‍යස්ථාන**
3.1 පුහුණු මධ්‍යස්ථානයක පවත්නා පහසුකම් 09-10
3.2 පුහුණු මධ්‍යස්ථාන ජාලය 11-13
3.3 පුහුණු මධ්‍යස්ථාන සිතියම 14

**4. ප්‍රගති සමාලෝචනය**
4.1 ආයතනික පුහුණුව (යෞවන යෞවනියන් පුහුණු කිරීම) 15
4.2 විශේෂ ජීවන කුසලතා සංවර්ධන වැඩසටහන් 16
4.3 තරුණ සංවර්ධන වැඩසටහන් 16
4.4 ව්‍යාපාර බාහිරකරණ පාඨමාලාව 17
4.5 බැහැරගත පුහුණුව 17
4.6 කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන් 17
4.7 මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 18
4.8 පරිපාලනය හා කාර්යමණ්ඩලය පිළිබඳ සමස්ත සටහන 18
4.9 මූල්‍ය විශේෂතා 19
4.10 මූල්‍ය නොවන වත්කම් 19
4.11 ජයග්‍රහණ 20
4.12 ඉදිරි ඉලක්ක 20

**5. මානව සම්පත් සංවර්ධනය**
5.1 කාර්ය මණ්ඩලය සඳහා පැවැත් වූ විවිධ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 21

**6. මූලික පුහුණු පාඨමාලාව** 23-27

**7. පුහුණු පාඨමාලාව අවසානයේ පුහුණුලාභීන් විසිරයෑම** 29-30

**8. වෘත්තීය පුහුණුවට යොමු කිරීම** 31-32

**9. විශේෂ පුහුණු පාඨමාලා**
9.1 හෝටල් පුහුණු පාඨමාලාව 33-37
9.2 ව්‍යාපාර බාහිරකරණ පුහුණු පාඨමාලාව 38-39
9.3 බැහැරගත පුහුණු පාඨමාලාව 40-42

**10. තරුණ සංවර්ධන වැඩසටහන්**
10.1 පාසල් ශිෂ්‍ය නායකයින් පුහුණු කිරීම 43-45
10.2 බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා වැඩසටහන 46-47
10.3 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන 48-50
10.4 නව යොවුන්විය සෞඛ්‍ය හා ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ වැඩසටහන 51-54
10.5 බෝ නොවන රෝග පිළිබඳ වැඩසටහන 54-56
10.6 රචනා තරඟාවලිය 57-59
10.7 විවාද තරඟාවලිය 60-63
10.8 දැනුම මිනුම තරඟාවලිය 63-65
10.9 ආපදා කළමනාකරණ වැඩසටහන 66-67
10.10 ක්‍රීඩා උලෙළ (පළාත්) 68
10.11 පරිසර ව්‍යාපෘතිය 69
10.12 ප්‍රජා සංවර්ධන වැඩසටහන 70-72
10.13 තරුණ සංවර්ධන වැඩසටහන් සාරාංශය (ක්ෂේත්‍රය අනුව) 73

**වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** 75-94
**විගණකාධිපති වාර්තා** 95-106
**විගණකාධිපති වාර්තා පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ** 107-118

# හැඳින්වීම

විනය, නායකත්වය, පෞරුෂ සංවර්ධනය යන ත්‍රිවිධ තේමාවන් පදනම් කරගනිමින් ක්‍රියාත්මක වන්නා වූ ජාතික යොවුන් සේනාංකය අනෙක් සියලු යෞවන පුහුණු බලගැන්වීම් අභිබවමින්, අභියෝගයන්ට ද අභියෝග කරන්නට පෞරුෂයෙන් හෙබි ශක්තිමත් යොවුන් බලකායක් ගොඩනැඟීම සඳහා පැහැදිලි වූත්, විධිමත් වූත් විවිධ පැතිකඩ හරහා ක්‍රියාත්මක වෙමින් පවතී.

ජාතිය නැවත ගොඩනැඟීමේ නව අභියෝගයට උරදිය හැකි නායකත්ව ගුණාංගයෙන් සහ ශක්තිමත් පෞරුෂයකින් හෙබි නිපුණතා පිරිපුන් තාරුණ්‍යයට මංපෙත් විවර කිරීම අත්‍යවශ්‍ය වූ වකවානුවක 2002 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් ව්‍යාපෘතියක් වශයෙන් ස්ථාපිත කොට, 2003 ඔක්තෝම්බර් මස 10 වන දින අංක 1309/17 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලෙස අංක 01-2003 දරණ යොවුන් බලකා නියෝග මඟින් යොවුන් සේනාංකය ක්‍රියාත්මක කරනු ලැබීය. එලෙස ක්‍රියාවට නැංවුණු ජාතික යොවුන් සේනාංකය රාජ්‍ය ආයතනයක් ලෙස 2002 වසරේ දෙසැම්බර් 17 වන දින, ටී.බී. ජයාමාවතේ (වත්මනේ) මහවැලි ගොඩනැඟිල්ලේ දී, කර්නල් චන්න ගුණතිලකගේ සභාපතීත්වයෙන් නිල වශයෙන් ආරම්භ විය. පුහුණු වන යෞවන යෞවනියන් රේන්ජර් නායකයින් යන නාමයෙන් හඳුන්වමින් පළමු පාඨමාලාව ඇඹිලිපිටිය, එරමිණියාය, හෙයියන්තුඩුව හා රන්ටැඹේ යන රේන්ජර් නායක පුහුණු මධ්‍යස්ථාන 04 කින් ආරම්භ කරන ලදී.

වර්තමානයේදී කර්නල් දර්ශන රත්නායක මැතිතුමාගේ සභාපතිත්වයෙන් නො 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 පිහිටි ප්‍රධාන කාර්යාලයකින්, දිවයින පුරා පිහිටි මධ්‍යස්ථාන 58 ක ජාලයකින් සහ දඹුල්ල හෝටල් පුහුණු පාසල, ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ ආයතනය (IBPO), නාවුල බැහැරගත පුහුණු මධ්‍යස්ථානය දක්වා ක්‍රමයෙන් වර්ධනය වෙමින් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙරට තරුණ ප්‍රජාවගෙන් 5% ක් පමණ පාසල් අධ්‍යාපනය නිසි ලෙස සම්පූර්ණ නොකොට පාසලින් ගිලිහී යන අතර තවත් 3 % ක කොටසක් සාමාන්‍යපෙළ විභාගය අවසානයේ ඉන් අසමත්ව පාසල් අධ්‍යාපනය හමාර කරනු ලබයි. එමෙන්ම අ.පො.ස උසස්පෙළ විභාගයට පෙනී සිටින දෙලක්ෂයකට ආසන්න වූ ශිෂ්‍ය ප්‍රජාවගෙන් 50 % ක්ම උසස් අධ්‍යාපන වරම් අහිමි වීම හේතුවෙන් පාසල් අධ්‍යාපනය හමාර කරනු ලබන්නේ කිසියම් හෝ ජීවන ඉලක්කයක් නොමැතිව වීම ශෝචනීය තත්ත්වයකි.

වර්තමාන අධ්‍යාපන රටාව තුළ මූලික භාෂා ගණිතමය හැකියාව පුරවැසියෙකු ලෙස ජීවත්වීමට අවශ්‍ය මූලික සමාජ දැනුම හා අන්තර් පුද්ගල සබඳතා පැවැත්වීමට අවශ්‍ය වන සංස්කෘතිය පවරාදීම මඟින් යහපත් ආකල්ප ගොඩනැගීම මෙන්ම ජීවිතය සරිකරගත හැකි ජීවන මාර්ගයකට කුසලතාවය පුද්ගලයකු තුළ ගොඩනිගිය යුතු වුවද විභාග මූලික මෙරට අධ්‍යාපන ක්‍රියාවලිය මඟින් එම වගකීම ඉටු නොවේ. අපේ අධ්‍යාපන ක්‍රියාවලියේ පවතින මෙම දුර්වලතාවය සමඟ සමාජගත වන තරුණ ප්‍රජාවගේ අභිවෘද්ධිය උදෙසා ජාතික යොවුන් සේනාංකය තම පාඨමාලා සංවිධානය කර ඇත. ඒ අනුව ජාතික යොවුන් සේනාංකයේ මූලික පාඨමාලාව හදාරන පුහුණුලාභීන්ට පහත සඳහන් විෂයයන් පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන අතර විශේෂයෙන් පන්ති කාමරයෙන් බැහැර ක්‍රියාකාරකම් බහුලව සංවිධානය කිරීම තුළින් ජීවන අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලබයි. 2020 වර්ෂය තුළදී සය මාසික මූලික පාඨමාලාවකින් පසු තම හැකියාව ලැදියාව අනුව තෝරාගනු ලබන වෘත්තීය ක්ෂේත්‍රයක වෘත්තීය පුහුණුවක් හා රැකියා පුහුණුවක් ලබා ගැනීමට අවශ්‍ය යොමු කිරීම, දිරිගැන්වීම හා අවශ්‍ය මූල්‍ය දායකත්වය පුහුණුලාභීන් වෙත ලබාදෙනු ලබයි.

වෘත්තීය පුහුණුව අවසානයේ රැකියාගත වීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා උපදේශනය ජාතික යොවුන් සේනාංකය මඟින් ඉටුකිරීම ද තරුණ ප්‍රජාවට ලබාදෙනු ලබන විශාල ශක්තියකි.



# 1. ජාතික යොවුන් සේනාංකයේ පාලනය

2002 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කර ඇති ජාතික යොවුන් සේනාංකය තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් සභාවක් මඟින් පාලනය වේ.

## 1.1 යොවුන් සේනාංක සභාව

ජාතික යොවුන් සේනාංක සභාව යොවුන් සංවර්ධනය, සේවා නියුක්තිය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල දැනුම සහ පළපුරුද්ද ඇති කාන්තාවන් අතරින් තෝරාගත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ. එහි එක් අයකු කාන්තා නියෝජනයක් විය යුතුය. තවද අමාත්‍යවරයා විසින් එම සාමාජිකයින් 05 දෙනා අතරින් එක් සාමාජිකයකු සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු බව යොවුන් සේනාංක පනතේ දෙවන වගන්තියේ සඳහන් වේ. සාමාජිකයින්ගේ ධූර කාලය වසර 03 කි.

**සභාව පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.**

අ. ජාතික යොවුන් සේනාංකය සඳහා සැලසුම් හා වැඩපිළිවෙළ සකස් කිරීම.

ආ. සම්පාදනය කරන ලද වැඩපිළිවෙළ අනුව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සැලසුම් හා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නියාමනය කිරීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම.

ඇ. යොවුන් සේනාංක සාමාජිකයන්ගේ පුහුණුව අධීක්ෂණය කිරීම.

ඈ. යොවුන් සේනාංක අධ්‍යක්ෂකවරයා විමසා සේනාංකයේ සාමාජිකයින්ගේ පුහුණුවට සහ කාර්යක්ෂමතාවයට අදාළ කොන්දේසි සහ පුහුණු වන්නා විසින් අත්කර ගැනීමට නියමිත නිපුණතාවයේ ප්‍රමාණය නිශ්චිතව දැක්වීම.

- 2020 වර්ෂය සඳහා ජාතික යොවුන් සේනාංක සභාව සඳහා සාමාජිකයින් නම්කර සිට නොමැත.



## 2. ආයතනික ව්‍යුහය

ජාතික යෞවුන් සේනාංකය යෞවුන් සේනාංක මූලස්ථාන කාර්යාලයක්, පළාත් කාර්යාල 09 ක්, පුහුණු මධ්‍යස්ථාන 58 ක්, බැහැරගත පුහුණු මධ්‍යස්ථානයක්, හෝටල් පුහුණු පාසලක් සහ ව්‍යාපාර බාහිරකරණ පුහුණු මධ්‍යස්ථානයකින් (IBPO) සමන්විත වේ.

### 2.1 අධ්‍යක්ෂ මණ්ඩලය

යෞවුන් සේනාංක මූලස්ථානය අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂකවරු 02 ක්, සහකාර අධ්‍යක්ෂකවරු 05 ක් හා සභා ලේකම් / නීති නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. එසේම 2016 වසරේදී තාවකාලික පදනම මත වසර 03 ක කාලයක් සඳහා අතිරේක අධ්‍යක්ෂ(සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) ලෙස තනතුරු 02 ක් ජාතික යෞවුන් සේනාංක මූලස්ථානය සඳහා අනුමතව ඇත. ඒ අනුව යෞවුන් සේනාංක මූලස්ථානයේ ක්‍රියාත්මක අංශ පහත පරිදි වේ.

## අතිරේක අධ්‍යක්ෂ(පරිපාලන හා මූල්‍ය) යටතේ ක්‍රියාත්මක අංශ

### පාලන අංශය - සහකාර අධ්‍යක්ෂ(පාලන)

සහකාර අධ්‍යක්ෂ(පාලන) යටතේ මානව සම්පත් ඒකකයක්, ප්‍රසම්පාදන ඒකකයක්, ප්‍රවාහන ඒකකයක් හා ඉදිකිරීම් සහ නඩත්තු ඒකකයක් ක්‍රියාත්මක වන අතර මේ සඳහා පරිපාලන නිලධාරී, කාර්මික නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ සහකාර ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදු කරයි. කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම, බඳවා ගැනීම, ස්ථාන මාරු සිදු කිරීම ඇතුළු මානව සම්පත් සංවර්ධන කටයුතු, මූලස්ථානයේ හා පුහුණු මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු පුහුණු පාඨමාලාව පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් සැපයීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

### මූල්‍ය අංශය - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) යටතේ ගිණුම් ඒකකයක්, මූල්‍ය ඒකකයක් හා ගබඩා ඒකකයක් ක්‍රියාත්මක වන අතර මේ සඳහා ගබඩා නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළු සියලු ගෙවීම් කටයුතු, ගිණුම් කටයුතුවලට අදාළ සියලු ලේඛන නඩත්තුව හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම, පුහුණු මධ්‍යස්ථාන වෙත අවශ්‍ය බඩුභාහිරාදිය බෙදාහැරීම ඇතුළු සියලු ගබඩා කටයුතු පවත්වාගෙන යෑම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

## අතිරේක අධ්‍යක්ෂ(පුහුණු හා සංවර්ධන) යටතේ ක්‍රියාත්මක අංශ

### පුහුණු අංශය - සහකාර අධ්‍යක්ෂ (පුහුණු)

සහකාර අධ්‍යක්ෂ (පුහුණු) යටතේ පුහුණු අංශය හා වෘත්තීය පුහුණු සහ NVQ ඒකක ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. පුහුණු මධ්‍යස්ථානයන් හි පවත්වනු ලබන මූලික පුහුණු පාඨමාලාවේ සියලු කටයුතු, පුහුණුලාභීන් වෘත්තීය පුහුණුවට යොමු කිරීම් හා පුහුණුලාභීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීමේ කටයුතු මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

### සංවර්ධන අංශය - සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන)

සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන) යටතේ සංවර්ධන අංශය ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. පුහුණු මධ්‍යස්ථානයන්ට පුහුණුලාභීන් බඳවා ගැනීම, පුහුණු කාලය තුළ පවත්වන කලා උලෙළ, ක්‍රීඩා උලෙළ, දැනුම මිනුම තරඟ, ප්‍රජා සත්කාරක වැඩසටහන් ආදී විවිධ වැඩසටහන් සංවිධානය කිරීම, පුහුණුලාභීන්ගේ විසිරයෑමේ පෙළපාළි කටයුතු, සහතිකපත් නිකුත් කිරීම් කටයුතු මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

### මෙහෙයුම් අංශය - සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්)

සහකාර අධ්‍යක්ෂ - (මෙහෙයුම්) යටතේ තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය ඒකක ක්‍රියාත්මක වන අතර මේ සඳහා අධීක්ෂණ නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයක් සිය සේවා දායකත්වය ලබාදීම සිදුකරයි. මූලස්ථානය හා සියලුම මධ්‍යස්ථාන ජාල ගත කර ජාලයක් ලෙස පවත්වා ගෙන යෑම, යොවුන් සේනාංක වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගෙන යෑම, මූලස්ථානයේ හා මධ්‍යස්ථානයන්හි තොරතුරු තාක්ෂණ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම, යොවුන් සේනාංකයේ සියලු මාධ්‍ය අවශ්‍යතා සපුරාලීම මෙම අංශයේ මූලික කාර්යයන් වේ.

### අතිරේක අධ්‍යක්ෂ(සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

2016 වර්ෂයේ දී ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතියේ රාජකාරි කටයුතු සඳහා තාවකාලික පදනම මත වසර 03 ක කාලයක් සඳහා අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ලෙස තනතුරු 02 ක් 2016 සැප්තැම්බර් මාසයේ දී අනුමත කර ගනු ලැබූ අතර ඒ සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි 2016 නොවැම්බර් මාසයේ දී අනුමත කර ගන්නා ලදී. 2017 වර්ෂයේ දී සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියකු ද්විතීය පදනම මත බඳවා ගන්නා ලද අතර නව මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු ඔහුගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී.

## යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අංශ

යොවුන් සේනාංක සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යෑමේ අරමුණින් නීති, අභ්‍යන්තර විගණන යන අංශ යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

### සභාලේකම් / නීති නිලධාරි

යොවුන් සේනාංක සභාව රැස්කිරීම ඒ ඒ අංශ වෙතින් ඉදිරිපත් කරන සභා පත්‍රිකා සභාව වෙත ඉදිරිපත් කිරීම, සභාව විසින් අනුමත කරනු ලැබූ සභා පත්‍රිකා ගනු ලැබූ තීරණ අදාළ අංශ හා නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම, සභාවේ සටහන් ලබා ගැනීම ඇතුළු සියලු සභා සාමාජිකයන් සම්බන්ධීකරණ කටයුතු හා යොවුන් සේනාංකය වෙනුවෙන් වන සියලුම නීතිමය හා අධිකරණමය කටයුතු සහ එම කටයුතුවලදී යොවුන් සේනාංකය වෙනුවෙන් පෙනී සිටීම ආදිය සිය කාර්ය මණ්ඩලයේ සේවා දායකත්වය සමඟින් අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

### අභ්‍යන්තර විගණන අංශය

යොවුන් සේනාංක අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ වූ කාර්ය මණ්ඩලයකින් සමන්විත අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වන අතර මෙමඟින් යොවුන් සේනාංක මූලස්ථානයේ හා සියලුම පුහුණු මධ්‍යස්ථානයන්හි විගණන කටයුතු සිදුකර විගණන විමසුම් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි.

## ජාතික යොවුන් සේනාංක තූර්ය වාදක කණ්ඩායම

සියලුම නවීන තූර්ය වාදක භාණ්ඩයන්ගෙන් සමන්විත බටහිර තූර්යවාදක කණ්ඩායමක් ජාතික යොවුන් සේනාංකය සතුවන අතර ත්‍රිවිධ හමුදාවේ තූර්යවාදන කණ්ඩායම්හි සාමාජිකත්වය දරා විශ්‍රාම යාමෙන් අනතුරු යොවුන් සේනාංකයේ සරඹ උපදේශක තනතුරු සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් මෙහි වාදකයින් ලෙසට කටයුතු කරනු ලබයි.

යොවුන් සේනාංක පුහුණුලාභීන්ගේ විසිරයෑමේ පෙළපාලි ඇතුළු උත්සව සඳහා මෙම තූර්යවාදක කණ්ඩායම යොදා ගන්නා අතර ජාතික නිදහස් දින පෙළපාලියට ද යොවුන් සේනාංක පුහුණුලාභීන් සමඟ මෙම තූර්යවාදක කණ්ඩායම සහභාගි වේ.

## 2.2 යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය

ජාතික යොවුන් සේනාංකය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂකවරයා ඇතුළු කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇති අතර එය ස්ථිර කාර්ය මණ්ඩලයක් හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ත්‍රිවිධ හමුදාවේ සේවය කර නීත්‍යානුකූලව ඉවත් වූ හෝ විශ්‍රාම ලබා ගත් අයවලුන්ගෙන් සමන්විත වන අතර ද්විතීයික පදනම මත බලකායේ රාජකාරි සඳහා ජාතික ශිෂ්‍යභට බලකායේ නිලධාරීන් ද ඇතුළත් කරගෙන ඇත.

### අධ්‍යක්ෂ/සභාපති

සේනාංකයේ අධ්‍යක්ෂකවරයා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර සේනාංකයේ පරිපාලනය, පුහුණුව, විනය කටයුතු සහ කාර්යක්ෂමතාව පිළිබඳ පූර්ණ වගකීම උසුලනු ලබයි.

අධ්‍යක්ෂකවරයා විසින්,

අ) සභාවේ තීරණ බලාත්මක කළ යුතු අතර

ආ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්ය ඉටුකිරීම සඳහා ද සභාවට අවශ්‍ය තොරතුරු සභාවට සැපයිය යුතුය

යනුවෙන් පනතේ 08 වන වගන්තියේ සඳහන් වේ.



# 2020 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | | | | |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික | පුරප්පාඩු | අතිරික්ත |
| ස්ථිර | | | | | | |
| අධ්‍යක්ෂ | HM 1-3 | 1 | | | | |
| අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) | HM 1-1 | 1 | | | | |
| අතිරේක අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) | HM 1-1 | 1 | | | | |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | MM 1-1 | 1 | | | | |
| සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | MM 1-1 | 1 | | | | |
| සහකාර අධ්‍යක්ෂ (පුහුණු) | MM 1-1 | 1 | | | | |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | MM 1-1 | 1 | | | | |
| සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) | MM 1-1 | 1 | | | | |
| සහාලේකම්/නීති නිලධාරි | MM 1-1 | 1 | | | | |
| අභ්‍යන්තර විගණන නිලධාරි | JM 1-1 | 1 | | | | |
| කාර්මික නිලධාරි | JM 1-1 | 1 | | | | |
| පරිපාලන නිලධාරි (මානව සම්පත්) | JM 1-1 | 1 | | | | |
| ප්‍රසම්පාදන නිලධාරි | JM 1-1 | 1 | | | | |
| ප්‍රවාහන නිලධාරි | JM 1-1 | 1 | | | | |
| සංවර්ධන සහකාර | MA 3 | 160 | | | | |
| සෞන්දර්ය උපදේශක | MA 1-1 | 20 | | | | |
| කළමනාකරණ සහකාර | MA 1-1 | 90 | | | | |
| දෙමළභාෂා පරිවර්ථක | MA 1-1 | 6 | | | | |
| උපදේශක (දෙමළ) | MA 1-1 | 57 | | | | |
| උපදේශක (තොරතුරු තාක්ෂණ) | MA 1-1 | 59 | | | | |
| උපදේශක (ඉංග්‍රීසි) | MA 1-1 | 58 | | | | |
| සරඹ/විනය උපදේශක | MA 1-1 | 100 | | | | |
| රියදුරු | PL 3 | 7 | | | | |
| පණිවිඩකරු | PL 3 | 1 | | | | |
| විදුලිකාර්මික | PL 3 | 1 | | | | |
| කාර්යාල සහායක | PL 1 | 33 | | | | |
| ගබඩාකරු | PL 1 | 39 | | | | |

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | තාවකාලික |
| **කොන්ත්‍රාත්** | | | | |
| සහකාර අධ්‍යක්ෂ (පළාත්) | MM 1 - 1 | 9 | | |
| මධ්‍යස්ථානාධිපති | JM 1 - 1 | 58 | | |
| සහාය මධ්‍යස්ථානාධිපති | JM 1 - 1 | 59 | | |
| උපදේශක (සරඹ) | MA 1 - 1 | 171 | | |
| ජාතික යොවුන් සමායෝජක | MA 1 - 1 | 33 | | |
| අතිරේක අධ්‍යක්ෂ (සැලසුම්) | HM 1 - 1 | | | 1 |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | MM 1 - 1 | | | 1 |
| සැලසුම් සම්බන්ධීකරණ නිලධාරී | JM 1 - 1 | | | 1 |
| කළමනාකරණ සහකාර | MA 1 - 1 | | | 1 |
| රියදුරු | PL 3 | | | 1 |
| කාර්යාල සහායක | PL 1 | | | 1 |
| **එකතුව** | | **647** | **330** | **6** |
| | | **983** | | |



## 2.3 සංවිධාන ව්‍යුහය






| | |
|---|---|
| Add. Dir (Admin & Fin.) | Additional Director (Administration & Finance) |
| Add. Dir (Trg & Dev) | Additional Director (Training & Development) |
| Ass. Dir (Admin) | Assistant Director (Administration) |
| Asst. Dir (Fin) | Assistant Director (Finance) |
| Asst. Dir (Trag) | Assistant Director (Training) |
| Ass. Dir (Dev) | Assistant Director (Development) |
| Asst. Dir (Op) | Assistant Director (Operation) |
| Cou. Sec/Leg. Off. | Council Secretary/Legal Officer |

| | |
|---|---|
| Ass. Dir (Pro.) | Assistant Director (Province) |
| AO | Administrative Officer |
| TO | Technical Officer |
| AO HR | Administrative Officer (HR) |
| Tra. Off | Transport Officer |
| Pro. Off | Procurement Officer |
| Acc. Off. | Account Officer |
| NA | Network Administrator |

| | |
|---|---|
| OIC | Officer in Charge |
| Asst. OIC | Assistant Officer in Charge |
| Pl.Co. Officer | Planning/Coordinating Officer |
| DA | Development Assistant |
| MA | Management Assistant |
| TT | Tamil Translator |
| IT | Information Technology Instructor |
| EI | Esthetic Instructor |

| | |
|---|---|
| TI | Tamil Instructor |
| DI | Drill Instructor |
| DDI | Drill/Disciplinary Instructor |
| NYC | National Youth Coordinator |
| DR | Driver |
| EL | Electrician |
| OA | Office Aide |
| SM | Store Man |

## 3. පුහුණු මධ්‍යස්ථාන

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය කේන්ද්‍ර කර ගනිමින් ජාතික යොවුන් සේනාංකයට අයත් පුහුණු මධ්‍යස්ථාන 58 කදී යොවුන් ශිෂ්‍යභටයින් පුහුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක වේ. පුහුණු මධ්‍යස්ථාන පළාත් වශයෙන් විසිරී ඇති ආකාරය පහත පරිදි වේ.

| පළාත | පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 05 |
| මධ්‍යම | 07 |
| දකුණ | 09 |
| වයඹ | 08 |
| නැගෙනහිර | 08 |
| උතුර | 03 |
| ඌව | 07 |
| උතුරු මැද | 05 |
| සබරගමුව | 06 |
| **එකතුව** | **58** |



## 3.1 පුහුණු මධ්‍යස්ථානයක පවත්නා පහසුකම්

භූමියේ පවත්නා ඉඩ පහසුකම් අනුව එක් අදියරකට පුහුණුලාභීන් 150 ත් 250 ත් අතර ප්‍රමාණයකට පුහුණුව ලබාදිය හැකි වන පරිදි පුහුණු මධ්‍යස්ථාන ගොඩනගා ඇති අතර බොහෝ පුහුණු මධ්‍යස්ථානයන්හි පහත සඳහන් පහසුකම් පවතී.

- කාර්යාලයක්
- පුහුණුලාභීන් 40 - 50 ට පුහුණුව ලැබිය හැකි පන්ති කාමර 4 හෝ 5
- දේශන ශාලාවක්
- පරිගණක 25 කින් සමන්විත පරිගණක විද්‍යාගාරයක්
- භෝජනාගාරයක්
- මුළුතැන්ගෙයක්
- දුර බැහැර පුහුණුලාභීන් සඳහා නේවාසික පහසුකම්
- ඇඳුම්මාරු කිරීමේ කාමර
- කාන්තා හා පිරිමි වැසිකිලි පද්ධතියක්
- ක්‍රීඩා පිටියක්
- අන්තර්ජාල හා දුරකථන පහසුකම්

**පුහුණු මධ්‍යස්ථානයකට පහත සඳහන් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත.**

| | | |
|---|---|---|
| • මධ්‍යස්ධානාධිපති | - | 01 |
| • සහාය මධ්‍යස්ථානාධිපති | - | 01 |
| • සංවර්ධන සහකාර (වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක) | - | 02 |
| • සංවර්ධන සහකාර (පෞරුෂ වර්ධන උපදේශක) | - | 01 |
| • සංවර්ධන සහකාර (සෞන්දර්ය උපදේශක) | - | 01 |
| • උපදේශක (තොරතුරු තාක්ෂණ) | - | 01 |
| • උපදේශක (ඉංග්‍රීසි) | - | 01 |
| • උපදේශක(දෙමළ) | - | 01 |
| • උපදේශක(සරඹ) | - | 03 |
| • කළමනාකරණ සහකාර | - | 01 |
| • සරඹ / විනය උපදේශක | - | 02 |
| • ගබඩාකරු | - | 01 |

ජාතික යොවුන් සේනාංක මූලස්ථානය යටතේ පළාත් කාර්යාල 09 ක් ක්‍රියාත්මක අතර පළාත් කාර්යාල 09 අධීක්ෂණය යටතේ මධ්‍යස්ථාන 58 ක් ක්‍රියාත්මක වේ.

## 3.2 පළාත් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථාන ජාලය

### පළාත් කාර්යාල

| අනු අංකය | පළාත් කාර්යාල | ලිපිනය | දුර.අංකය |
|---|---|---|---|
| 1 | බස්නාහිර | බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය<br>වැරැල්ලවත්ත, යක්කල. | 0701278220 |
| 2 | මධ්‍යම | මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය<br>සිරිමල්උයන, ඔගස්ටාවත්ත, මහනුවර. | 0718457013 |
| 3 | දකුණ | දකුණු පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය<br>දකුණු පළාත, බෝපේ, ගාල්ල. | 0702587434 |
| 4 | වයඹ | වයඹ පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>උසාවි පාර, වාරියපොළ. | 0718457013 |
| 5 | උතුරුමැද | උතුරු මැද පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>මහවැලි පැත්ත, ඔලුකරඳ, කැකිරාව. | 0718289004<br>025-9264180 |
| 6 | ඌව | ඌව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය,<br>යාලබෝවවත්ත, වැල්ලවාය. | 0770460352<br>057-2052393 |
| 7 | සබරගමුව | සබරගමුව පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>ගංගොඩවත්ත, කෑගල්ල. | 0702576555 |
| 8 | නැගෙනහිර | නැගෙනහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය,<br>රවුන් පාර, සද්ධාපුර, ත්‍රිකුණාමලය. | 0712518825 |
| 9 | උතුර | උතුරු පළාත් අධ්‍යක්ෂ කාර්යාලය<br>යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය,<br>ඉරට්ටපෙරියකුලම්, වව්නියාව. | 0710889436 |

## පුහුණු මධ්‍යස්ථාන

| අනු අංක | පළාත | මධ්‍යස්ථානය | ලිපිනය | දුර.අංකය |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර | කටුනායක | ධම්මාලෝක මාවත, වලාන, කටුනායක. | 0112 - 260 020 |
| 2 | | අත්තනගල්ල | වතුපිටිවල, අත්තනගල්ල, නිට්ටඹුව. | 033 - 228 2232 |
| 3 | | දිවුලපිටිය | වල්පිට, දිවුලපිටිය. | 033 - 227 2875 |
| 4 | | බුලත්සිංහල | ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානය, බුලත්සිංහල. | 034 - 228 2322 |
| 5 | | යක්කල | වැරැල්ලවත්ත, යක්කල. | 033 - 223 3534 |
| 6 | මධ්‍යම | ගම්පොළ | නාවලපිටිය පාර, කුඩමාකේ, ගම්පල. | 081 - 207 8177 |
| 7 | | නාඋල | අරංගල, නාඋල. | 066 - 224 6204 |
| 8 | | නුවරඑළිය | මීපිලිමාන, අඹේවල, නුවරඑළිය. | 052 - 353 6332 |
| 9 | | හඟුරන්කෙත | රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත. | 081 - 236 5849 |
| 10 | | වලපනේ | හරස්බැද්ද, වලපනේ. | 052 - 205 0010 |
| 11 | | සෙංකඩගල | සිරිමල් උයන, ඔගස්ටාවත්ත, නුවර. | 081 - 238 9134 |
| 12 | | යටිනුවර | යටිනුවර, පිලපිටිය, මුරුතලාව. | 081 - 241 0026 |
| 13 | දකුණ | ගාල්ල | වැකුණුගොඩ, බෝපේ, ගාල්ල. | 091 - 223 3182 |
| 14 | | නෙළුව | පියසේන ගමගේ ගොඩනැගිලි සංකීර්ණය, අඹලේගෙදර, නෙළුව. | 091 - 309 8911 |
| 15 | | අකුරැස්ස | මාරඹ, අකුරැස්ස. | 041 - 313 1216 |
| 16 | | වීරකැටිය | නයිගල, හකුරුඇළ, වීරකැටිය. | 047 - 225 7143 |
| 17 | | සූරියවැව | මධ්‍යවිද්‍යාල පාර, සූරියවැව. | 047 - 228 8169 |
| 18 | | අක්මීමන | කුරුඳුවත්ත, අක්මීමන. | 091 - 312 1736 |
| 19 | | දික්වැල්ල | ඌරුගමුව, දික්වැල්ල. | 041 - 225 5055 |
| 20 | | ලුණුගම්වෙහෙර | ලුණුගම්වෙහෙර, තලාව. | 047 - 223 9292 |
| 21 | | වීරවිල | ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානය, වීරවිල. | 047 - 312 8444 |
| 22 | වයඹ | කුලියාපිටිය | දෙගම්මැද්ද, වැවගම, කුලියාපිටිය. | 037 - 228 3680 |
| 23 | | වාරියපොළ | උසාවි පාර, වාරියපොළ. | 037 - 226 8375 |
| 24 | | මාවතගම | ඩොන්වෝර් වත්ත, මාවතගම. | 037 - 229 8668 |
| 25 | | පඬුවස්නුවර | නුගවෙල හන්දිය, පඬුවස්නුවර. | 037 - 229 1803 |
| 26 | | දොඩම්ගස්ලන්ද | අලකොලමඩ,මදුරාගොඩ, දොඩම්ග ස්ලන්ද. | 037 - 225 2655 |
| 27 | | නාත්තණ්ඩිය | සාගරගම, නාත්තණ්ඩිය. | 032 - 205 0815 |
| 28 | | වෙන්නප්පුව | රණවිරු කමලසිරි මාවත,බෝලාන, වයික්කාල්. | 031 - 227 7199 |
| 29 | | අලව්ව | වලිගමුව, අලව්ව. | 037 - 206 7885 |

| අනු අංක | පළාත | මධ්‍යස්ථානය | ලිපිනය | දුර.අංකය |
|---|---|---|---|---|
| 30 | උතුරුමැද | කැකිරාව | මහවැලි පැත්ත, ඔලුකරඳ, කැකිරාව. | 025 - 226 3297 |
| 31 | | කලාවැව | ගල්නෑව, බුල්නෑව, කලාවැව. | 025 - 226 9946 |
| 32 | | අනුරාධපුර | මාපාලඩිකුලම්, අනුරාධපුර. | 025 - 385 2809 |
| 33 | | මැදිරිගිරිය | කවුඩුළුගම, මැදිරිගිරිය. | 027 - 205 0477 |
| 34 | | ගලෙන්බිඳුණුවැව | යක්කල, ගලෙන්බිඳුණුවැව. | 025 - 225 8355 |
| 35 | ඌව | බණ්ඩාරවෙල | බිඳුණුවැව, බණ්ඩාරවෙල. | 057 - 222 2214 |
| 36 | | මහියංගණය | මාපාකඩ, මහියංගණය. | 055 - 225 7118 |
| 37 | | තණමල්විල | බෝදාගම, මහියංගණය. | 047 - 322 0529 |
| 38 | | කතරගම | පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, කඳසුරිඳුගම, කතරගම. | 047 - 2236625 |
| 39 | | මොණරාගල | වැලියාය, මොණරාගල. | 055 - 205 5741 |
| 40 | | වැල්ලවාය | යාලබෝවවත්ත, වැල්ලවාය. | 055 - 2274157 |
| 41 | | සියඹලාණ්ඩුව | 19 වෙනි සැතපුම, පොතුවිල්පාර, සියඹලාණ්ඩුව. | 0703538292 |
| 42 | සබරගමුව | නිවිතිගල | අම්බලන්දෙණිය,වටපොතපාර, නිවිතිගල. | 045 - 227 9970 |
| 43 | | ගලිගමුව | අසිදෙනිය, ගලිගමුව නගරය, ගලිගමුව. | 035 - 228 2993 |
| 44 | | ඇඹිලිපිටිය | 'ගම් උදා' ඉඩම, යෝධගම, ඇඹිලිපිටිය. | 047 - 226 2399 |
| 45 | | කෑගල්ල | ගංගොඩවත්ත, කෑගල්ල. | 035 - 222 3260 |
| 46 | | බලංගොඩ | බටුගම්මන, බලංගොඩ. | 045 - 312 9898 |
| 47 | | දෙහිඕවිට | කනන්ගම, දෙහිඕවිට. | 036 - 226 7671 |
| 48 | නැගෙනහිර | අම්පාර | අධ්‍යාපන පරිපාලන කාර්යාලය, උහන පාර, අම්පාර. | 063 - 222 4810 |
| 49 | | සේරුවාවිල | සේරුවාවිල, අලිඔළුව, සේරුනුවර. | 026 - 454 9439 |
| 50 | | ගෝමරන්කඩවල | විල්පානකුලම, ගෝමරන්කඩවල. | 026 - 454 9428 |
| 51 | | කුච්චවේලි | සලපේආරු, කුච්චවේලි. | 026 - 222 8709 |
| 52 | | මුතූර් | ත්‍රීසිඩ් හන්දිය, මඩකලපුව පාර, මුතූර්. | 0704830253 |
| 53 | | ත්‍රිකුණාමලය | රවුන් පාර, සද්ධාපුර, ත්‍රිකුණාමලය. | 026 - 454 9432 |
| 54 | | දෙහිඅත්තකණ්ඩිය | ලිහිණියාගම, දමනවෙල, දෙහිඅත්තකණ්ඩිය. | 027 - 205 6723 |
| 55 | | වාලච්චේන | 18 කණුව, ගාන්ධිනගර් පාර. කල්කුඩා, වාලච්චේන. | 065 - 312 1085 |
| 56 | උතුර | මුලතිව් | වට්ටුවාක්කල්, මුලතිව්. | 021 - 229 0428 |
| 57 | | මන්නාරම | තලෙයිමන්නාරම පාර, මන්නාරම. | 023 - 225 1917 |
| 58 | | වව්නියාව | ඉරට්ටපෙරියකුලම්, වව්නියාව. | 024 - 205 4558 |

## 3.3 පුහුණු මධ්‍යස්ථාන පිහිටීම් සිතියම



# 4. ප්‍රගති සමාලෝචනය - 2020

2020 වර්ෂයේ දී තරුණ සංවර්ධනය හා වෘත්තීය පුහුණුව අරමුණු කොට ගෙන වැඩසටහන් රැසක් සැලසුම් කර තිබුණු අතර එම වැඩසටහන්හි ප්‍රගති සමාලෝචනය පහත පරිදි වේ.

### 4.1 ආයතනික පුහුණුව (යෞවන යෞවනියන් පුහුණු කිරීම)

| ක්‍රියාකාරකම | ඉලක්කගත | | ප්‍රගතිය | | | | ඉදිරි ඉලක්කය |
|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් | සහභාගිත්වය | වැඩසටහන් | සහභාගිත්වය | | | |
| | | | | ගැහැණු | පිරිමි | එකතුව | |
| ආයතනික පුහුණුව | 119 | 12,300 | 116 | 6160 | 7236 | 13,396 | 2021 වර්ෂයේ පාඨමාලා 02 පැවැත්වීමට සැලසුම් කර ඇති අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත ආයතනයකින් ICT සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සහතිකපත් ලබාදීමට සැලසුම් කර ඇත. |



## 4.2 විශේෂ ජීවන කුසලතා සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ඉලක්කගත | | ප්‍රගතිය | | ඉදිරි ඉලක්කය |
|---|---|---|---|---|---|
| | වැඩසටහන් | සහභාගිත්වය | වැඩසටහන් | සහභාගිත්වය | |
| පාසල් ශිෂ්‍ය නායකයින් පුහුණු කිරීම | 0 | 1000 | 30 | 2162 | පෙර වර්ෂ වල මෙන් තරුණ සංවර්ධන වැඩසටහන් සෞඛ්‍ය නීති රීතීන්ට අනුගත වෙමින් පැවැත්වීමට සැලසුම් කර ඇත. |
| බහු කාර්ය සංවර්ධන කාර්යය සාධක බලකා වැඩසටහන | 85 | 11,838 | 105 | 29,643 | |

## 4.3 තරුණ සංවර්ධන වැඩසටහන්

| ක්‍රියාකාරකම | ඉලක්කගත | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | වැඩසටහන් | සහභාගිත්වය | වැඩසටහන් | සහභාගිත්වය |
| ලිංගික සම්ප්‍රේෂණ රෝග (STD) වැළැක්වීමේ වැඩසටහන | 119 | 12300 | 94 | 8985 |
| බෝ නොවන රෝග (NCD) වැළැක්වීමේ වැඩසටහන | 119 | 12300 | 89 | 8528 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 119 | 12300 | 91 | 8414 |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවුවන් පුනුරුත්ථාපනය කිරීමේ වැඩසටහන (NDDCB සමඟ සහයෝගීතාවය වැඩසටහන) | 1 | 200 | 1 | 27 |
| පරිසරය සුරැකීමේ වැඩසටහන් (පාරිසරික ව්‍යාපෘතිය) | 119 | 12300 | 23 | 2584 |
| ක්‍රීඩා උළෙල(මධ්‍යස්ථාන මට්ටම) | 119 | 12300 | 18 | 1355 |
| විවාද තරඟාවලිය (මධ්‍යස්ථාන මට්ටම) | 119 | 1904 | 91 | 7964 |
| රචනා තරඟාවලිය (මධ්‍යස්ථාන මට්ටම) | 119 | 12300 | 93 | 7710 |
| දැනුම මිනුම තරඟ (මධ්‍යස්ථාන මට්ටම) | 119 | 12300 | 88 | 7727 |
| අපදා කළමනාකරණ වැඩසටහන (දින තුනක) | 119 | 12300 | 67 | 7620 |
| ප්‍රජා සංවර්ධන වැඩසටහන | 119 | 12300 | 67 | 4710 |
| විසිරයාමේ උළෙල (මධ්‍යස්ථාන මට්ටම) | 199 | 12300 | 58 | 9629 |
| වෘත්තීය පුහුණුව ලබාදීම | | 5700 | | 1364 |

# අභියෝග

පැවැති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පුද්ගල දුරස්ථභාවය පවත්වාගැනීම හා සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතු වීම වැනි හේතූන් මත පුහුණු කටයුතු සැලසුම් කර තිබුණු පරිදි සිදු කිරීමට නොහැකි විය.

### 4.4 ව්‍යාපාර බාහිරකරණ පාඨමාලාව (IBPO)

| වැඩසටහන | ජයග්‍රහණ සහ ළඟාකරගත් ඉලක්ක | ඉදිරි ඉලක්ක | අභියෝග |
|---|---|---|---|
| IBPO | පුහුණු ලාභීන් /ලාභිනියන් 08 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම. | IBPO ක්ෂේත්‍රයේ වැඩි රැකියා අවස්ථාවන් සඳහා පුහුණුලාභීන් /ලාභිනියන් තවදුරටත් දැනුවත් කරමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම. | පවතින covid-19 තත්ත්වය අනුව පුද්ගල දුරස්ථභාවය පවත්වාගැනීම හා සෞඛ්‍ය නිතිරීතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වීම ආදී හේතූන් මත පුහුණු කටයුතු සිදු කිරීමට නොහැකි විය. |

### 4.5 බැහැරගත පුහුණුව (ABT)

| වැඩසටහන | ජයග්‍රහණ සහ ළඟාකරගත් ඉලක්ක | ඉදිරි ඉලක්ක | අභියෝග |
|---|---|---|---|
| බැහැරගත පුහුණුව (ABT) | ජාතික යොවුන් සේනාංකයේ අභ්‍යන්තර පුහුණු ලාභීන් /ලාභිනියන් 5001 දෙනෙකු සඳහා බැහැරගත පුහුණුව ලබා දීම. | ආයතනික උපාය මාර්ගයන්ට අනුකූලව බැහැරගත පුහුණු මධ්‍යස්ථානය (නාඋල) සංවර්ධනය කරමින් අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වයන් වෙනුවෙන් බැහැරගත පුහුණුව ලබා දීමට කටයුතු කිරීම. එමෙන්ම සෑම පුහුණු මධ්‍යස්ථානයකම බැහැරගත ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා බැහැරගත අංගනයක් නිර්මාණය කිරීම. | පවතින covid -19 තත්ත්වය අනුව පුද්ගල දුරස්ථභාවය පවත්වාගැනීම හා සෞඛ්‍ය නිතිරීතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වීම ආදී හේතූන් මත පුහුණු කටයුතු සිදු කිරීමට නොහැකි විය. |

### 4.6 කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන්

| වැඩසටහන | ජයග්‍රහණ සහ ළඟාකරගත් ඉලක්ක | ඉදිරි ඉලක්ක | අභියෝග |
|---|---|---|---|
| පුහුණු කරුවන් පුහුණු කිරීම (TOT) | පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර ඇත. | ඉදිරි වාර්ෂික සැලැස්මට අනුකූලව වඩා හොඳ මානව සම්පත් කළමනාකරණයක් සහ සංවර්ධනයක් උදෙසා අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි. | පවතින covid -19 තත්ත්වය අනුව පුද්ගල දුරස්ථභාවය පවත්වාගැනීම හා සෞඛ්‍ය නිතිරීතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වීම ආදී හේතූන් මත පුහුණු කටයුතු සිදු කිරීමට නොහැකි විය. |
| කාර්යමණ්ඩල පුහුණු කිරීම | ආයතනික නිලධාරීන් 02 දෙනෙකුට පුහුණුව ලබා දීමට කටයුතු කර ඇත. | සමස්ථ කාර්යය මණ්ඩලයේ කාර්යය සාධනයන් සහ ඵලදායිත්වය ඉහල නැංවීම උදෙසා කාර්යය මණ්ඩල පුහුණු සැසි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | |

## 4.7 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාලසීමාව | සමස්ථ ආයෝජනය (Rs.000) | | වැඩසටහනේ ස්වභාවය | | නිමැවුම /ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | දේශීය | විදේශීය | |
| 1 | TOT | 196 | දින දෙක බැගින් | 532,728.70 | | දේශීය | | පුහුණු කරුවන් පුහුණු කිරීම තුලින් දැනුම කුසලතා ආකල්ප වලින් සංවර්ධනය කිරීම. |
| 2 | කාර්යමණ්ඩල පුහුණු | 2 | දින එක බැගින් | 11,000.00 | | දේශීය | | අදාළ විෂය පථය තුළ ඵලදායි කාර්යය සාධනයක් සඳහා මනා මානව සම්පත් සංවර්ධනයක් සිදුවීම. |

## 4.8 පරිපාලනය හා කාර්ය මණ්ඩලය පිළිබඳ සමස්ත සටහන

ජාතික යොවුන් සේනාංකය ස්ථාපිත කළ තැන් පටන් ඒ ඒ විෂය භාර අමාත්‍යවරුන් විසින් සභාපතිවරුන් 10 දෙනෙකු පත් කරන ලදී. ජාතික යොවුන් සේනාංකයෙහි පරිපාලන හා සේවා අංශයන්ගෙන් විහිදුණු 623 දෙනෙකුගෙන් සමන්විත ස්ථිර කාර්ය මණ්ඩලයක් ඇත.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු /(අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 18 | 13 | 5 |
| තෘතියික | 125 | 78 | 47 |
| ද්විතියික | 716 | 456 | 260 |
| ප්‍රාථමික | 89 | 76 | 13 |
| කොන්ත්‍රාත්/අනියම් | - | - | - |
| **එකතුව** | **948** | **623** | **325** |

ජාතික යොවුන් සේනාංකයේ ඉහත පුරප්පාඩු වී ඇති බොහොමයක් තනතුරු, පුහුණු මධ්‍යස්ථානයන්හි උපදේශක තනතුරු වන බැවින් ජාතික යොවුන් සේනාංක පුහුණු පාඨමාලා විධිමත් හා අඛණ්ඩව පවත්වාගෙන යෑමේ දුෂ්කරතාවයකට මුහුණ දී ඇත. විශේෂයෙන්ම මෙම තනතුරු පුරප්පාඩු වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වනුයේ රජයේ අනෙකුත් ආයතනයන්හි සේවකයන්ට ලැබෙන වරප්‍රසාද යොවුන් සේනාංක සේවකයන්ට නොලැබෙන බැවින් විශ්‍රාම වැටුප් හා අනෙකුත් වරප්‍රසාද සහිත රජයේ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සඳහා බඳවාගැනීම් සිදු කරනු ලබන අවස්ථාවන් හි ජාතික යොවුන් සේනාංකයේ සේවකයන් යොවුන් සේනාංක සේවයෙන් ඉවත්ව එම තනතුරු ලබා ගැනීම සදහා යෑමේ ප්‍රවණතාවයක් දක්නට ඇත.

### 4.9 මූල්‍ය විශේෂතා

2020 වර්ෂයේදී පුනරාවර්තන වියදම්වල හා ප්‍රාග්ධන වියදම්වල මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| ප්‍රතිපාදන වර්ග | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන්කරන ලද අවසාන ප්‍රතිපාදන % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 774,774,000.00 | 637,920,000.00 | 607,684,512.02 | 95.% |
| ප්‍රාග්ධන | 475,000,000.00 | 425,000,000.00 | 261,106,736.72 | 61% |

**මූල්‍ය ප්‍රගතිය**




**පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සංයුතිය**

### 4.10 මූල්‍ය නොවන වත්කම්

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය |
|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 261,243,017.00 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 47,396,372.00 |
| 9153 | ඉඩම් | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | |
| 9160 | කෙරීගෙන යන වැඩ | 2,209,490,428.00 |
| 9180 | බදු දෙන ලද වත්කම් | |

### 4.11 ජයග්‍රහණ

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සමඟ 2020.08.14 දින අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව කටුනායක පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූ සේවාලාභීන් 25 දෙනෙකු සඳහා මෘදු කුසලතා සහ නායකත්ව පුහුණු වැඩසටහන සාර්ථකව නිම කරමින් 18 දෙනෙකුගෙන් යුතු පුහුණුලාභීන් සංඛ්‍යාවක් 2020.12.24 වන දින පාඨමාලාව නිම කර පිටව යන ලදී.
- තම ආයතනයේ වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු වන සියලුම පුහුණුලාභීන් සඳහා මෘදු කුසලතා සංවර්ධනය මූලික පුහුණුවක් ලබාදීම අරමුණු කර ගනිමින් වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ 2020.07.30 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- අමාත්‍යංශය යටතේ පවතින තරුණ සේවා සභාව,කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය SMART Srilanka ආයතන සමඟ එම ආයතන වල පුහුණුව සහ අධ්‍යාපනය හදාරනු ලබන පුහුණු ලාභීන් සඳහා මෘදු කුසලතා සංවර්ධනය මූලික පුහුණුවක් ලබාදීම උදෙසා 2020.07.30 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- බහු කාර්යය සංවර්ධන කාර්යය සාධක බලකා දෙපාර්තමේන්තුව සහ ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යන ආයතන ඒකාබද්ධව ප්‍රාථමික ශිල්පීය ශ්‍රේණි ගණයට අලුතින් බඳවා ගන්නා ලද ලක්ෂයක් නුපුහුණු ශ්‍රමිකයින් සඳහා පැවැත්වීමට අපේක්ෂිත පුහුණු වැඩමුළුවෙහි පළමු අදියර වශයෙන් 35,000 බඳවා ගත් අතර මේ වන විට 20104 පමණ පුහුණුලාභීන් පිරිසක් පුහුණුව අවසන් කර ඇත.
- අධ්‍යාපන අමාත්‍යංශය සමඟ ඒකාබද්ධ වෙමින් උසස්පෙළ වෘත්තීය විෂය ධාරාව යටතේ අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂිත සිසු දරුදැරියන් 656 සඳහා ජීවන කුසලතා සහ නායකත්ව පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

### 4.12 ඉදිරි ඉලක්ක

- ජාතික යෞවුන් සේනාංකය සඳහා සංයුක්ත සැලැස්මක්(Corporate Plan) සම්පාදනය කිරීම.
- ජාතික යෞවුන් සේනාංක සෑම පුහුණු මධ්‍යස්ථානයකම තරුණ උපදේශන අංශයක් පිහිටුවීම.
- නවීන කෘෂි තාක්ෂණික සහ පාරිසරික කෘෂි පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම - මීපිලිපාන, නුවරඑළිය
- විශේෂිත විදේශීය භාෂා පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම - කටුනායක
- සුහුරු පන්ති කාමර (Smart Class Room) ස්ථාපිත කිරීම.
- ක්‍රීඩා විභවයන් සහිත තරුණ තරුණියක් හඳුනාගනිමින් ජාතික මට්ටම දක්වා සංවර්ධනය කිරීම.
  - නෙට්බෝල්, දුනුවිදීම සහ වෙඩි තැබීම.
- මූලික පාඨමාලාවට සහභාගිවීමට නොහැකි තරුණ තරුණියන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පාඨමාලා පැවැත්වීම.

# 5. මානව සම්පත් සංවර්ධනය

ජාතික යොවුන් සේනාංකයේ අධ්‍යයන හා අනධ්‍යන කාර්යමණ්ඩලයේ දැනුම් හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා විවිධ වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා පුහුණු ප්‍රතිපත්තියක් සකසා ඇති අතර එම ප්‍රතිපත්තිය පරිදි කාර්ය මණ්ඩලයේ ඒ ඒ තනතුරු අනුව තම තනතුරේ කාර්යභාරයට අදාළ පුහුණු පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත. මෙහිදී අදාළ පාඨමාලා ගාස්තු රු. 10,000.00 සිට රු. 75,000.00 දක්වා යොවුන් සේනාංකය මඟින් දරනු ලබයි.

එසේම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වැනි කාර්ය මණ්ඩල පුහුණු කරනු ලබන ආයතන විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ද යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය යොමු කර ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට හා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබයි.

තවද ලැබෙන ශිෂ්‍යත්ව වැනි අවස්ථාව අනුව තෝරාගනු ලැබූ යොවුන් සේනාංක කාර්ය මණ්ඩල සාමාජිකයින් විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදිය සඳහා ද යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීන සම්පත්දායකයින් සහභාගි කර ගනිමින් යොවුන් සේනාංක කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩමුළු යොවුන් සේනාංක මූලස්ථානයේදී මෙන්ම පුහුණු මධ්‍යස්ථානයන්හි දී ක්‍රියාත්මක කරනු ලබයි. මේ අනුව මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා යොවුන් සේනාංකය වැඩි අවධානයක් යොමු කර ඇත.

### 5.1 කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ විවිධ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් (පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් - Training of Trainees Programmes - TOT ඇතුළුව)

<table>
<tr><th>අනු අංකය</th><th>දිනය</th><th>පුහුණු වැඩසටහන</th><th>සහභාගිත්වය</th><th>ප්‍රමාණය</th><th>පැවැත්වූ ස්ථානය</th><th>සම්පත් දායකත්වය</th></tr>
<tr><td>1</td><td>2020.01.21</td><td>වෘත්තීය පුහුණු සැලසුම් පිළිබඳ දැනුවත් කිරීම</td><td>මධ්‍යස්ථානය තුළ වෘත්තීය පුහුණු සැලසුම් සිදු කරන උපදේශක උපදේශිකාවන්</td><td>64</td><td>මූලස්ථාන ශ්‍රවණාගාරය</td><td>එම්. කමනි මෙනවිය</td></tr>
<tr><td>2</td><td>2020.01.24</td><td rowspan="2">දෛනික පදනම මත නවක පත්වීම් ලද වෘත්තීය මාර්ගෝපදේශන සහ පෞරුෂ සංවර්ධන උපදේශක උපදේශිකාවන් සඳහා විෂය නිර්දේශය හඳුන්වා දීම</td><td rowspan="2">දෛනික පදනම මත නවක පත්වීම් ලද වෘත්තීය මාර්ගෝපදේශන සහ පෞරුෂ සංවර්ධන උපදේශක උපදේශිකාවන්</td><td>38</td><td rowspan="2">මූලස්ථාන ශ්‍රවණාගාරය</td><td>සිරි නානායක්කාර මිය, එම් කමනි මෙනෙවිය, ඉමේෂ් කුලතුංග මහතා</td></tr>
<tr><td>3</td><td>2020.01.25</td><td>36</td><td>අජිත් ජයවර්ධන මහතා</td></tr>
<tr><td>4</td><td>2020.07.31</td><td>තොරතුරු තාක්ෂණ උපදේශන පුහුණුව (EWISS)</td><td>EWISS Computer පවතින මධ්‍යස්ථාන වල තොරතුරු තාක්ෂණ උපදේශක උපදේශිකාවන්</td><td>22</td><td>මූලස්ථාන ශ්‍රවණාගාරය</td><td>නිවන්ත මහතා</td></tr>
<tr><td>5</td><td>2020.12.14 - 2020.12.26</td><td>නවක පත්වීම් ලද සහය මධ්‍යස්ථානාධිපතිවරුන් සඳහා පුහුණු වැඩමුළුව</td><td>නව සහය මධ්‍යස්ථානාධිපතිවරුන්</td><td>36</td><td>නාඋල බැහැරගත පුහුණු මධ්‍යස්ථානය</td><td>කර්නල් චන්න කරුණාරත්න මහතා, නිශාන්ත පුෂ්පකුමාර මහතා, ජනනි අබේසිංහ මෙනෙවිය, ඉමේෂ් කුලතුංග මහතා, විරාජ් අබේසිංහ මහතා, එම්. කමනි මෙනෙවිය.</td></tr>
</table>


EXTERNAL COMPONENT OF A COMPUTER
Lenovo



# 6. මූලික පුහුණු පාඨමාලාව

ජාතික යොවුන් සේනාංක ජීවන කුසලතා (Life Skills) මූලික පුහුණු පාඨමාලාව ශ්‍රී ලාංකේය යෞවන පරපුර විනය, නායකත්වය හා පෞරුෂයෙන් පිරිපුන් සහ දැනුම, කුසලතා හා ආකල්පයන්ගෙන් පරිපූර්ණ පිරිසක් බවට පත් කිරීමේ අරමුණින් නිර්මාණය කර ඇත.

පාඨමාලාව සඳහා ඇතුළත් විය හැක්කේ,

- පාසල් හැරගිය වයස අවුරුදු 18 - 28 ත් අතර ශ්‍රී ලාංකීය යෞවන යෞවනියන්,
- අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග අවසන් කොට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින තරුණ තරුණියන්,
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති තරුණ තරුණියන්,
- වෘත්තිය අධ්‍යාපන ආයතන පුහුණුලාභීන්,
- පාසල් පද්ධතිය තුළ වෘත්තිය විෂය ධාරාවට යොමුවන සිසුන්
- රාජ්‍ය හා පෞද්ගලික අංශය විසින් විවිධ අවස්ථාවන්හි පුහුණුව සඳහා යොමු කරන තරුණ පිරිස.

විශේෂයෙන් මූලික ජීවන කුසලතා පාඨමාලාව හැරුණු කොට ඒ ඒ තරුණ පිරිස්වලට හා ආයතනවලට ගැලපෙන පරිදි පාඨමාලාවේ අන්තර්ගතය සුදුසු පරිදි වෙනස් කොට පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලබයි.

පුහුණුලාභීන් සඳහා ලැබෙන ප්‍රතිලාභ

- පුහුණු කාලසීමාව තුළ රු. 3,000.00 ක මාසික දීමනාවක්
- නිළ ඇඳුම්
- පුහුණු කාලසීමාව තුළ පැය 24 ම ආවරණය වන පරිදි රු. 500,000.00 ක ජීවිත රක්ෂණාවරණයක්
- මූලික පුහුණු පාඨමාලාවෙන් අනතුරුව වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යොමු කිරීම හා ඒ සඳහා රු. 10,000.00 ක් දක්වා වන පාඨමාලා ගාස්තුවක් ලබාදීම.

යෞවන යෞවනියන් පන්ති කාමරයකට සීමා නොකොට ඔවුන්ට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලැබෙන අයුරින් විවිධ ක්‍රියාකාරකම් අනුසාරයෙන් අවශ්‍ය දැනුම ලබා ගැනීමට හැකිවන පරිදි මෙම පාඨමාලාව සකස් කර ඇත.

මෙම පාඨමාලාව දිවයින පුරා විසිරී පවතින ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන 55 ක විෂය පිළිබඳ සුදුසුකම්ලත් උපදේශක උපදේශිකාවන් විසින් නොමිලයේම පවත්වනු ලබයි.

ජීවන කුසලතා (Life skills) විෂය නිර්දේශයේ අන්තර්ගතය පහත පරිදි වේ.

A. සමාජය සහ සංස්කෘතිය

B. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය

C. වෘත්තීය මාර්ගෝපදේශනය

1. වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය හා බැඳුනු සංකල්පීය විග්‍රහය.
2. ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය ස්වයං අවබෝධය සහ ඉලක්ක පිහිටුවා ගැනීම.
3. ශ්‍රම වෙළෙඳපොළ සඳහා ප්‍රවේශ වීම.
4. වැඩලෝකය හඳුනාගැනීම සහ ඊට පිවිසීමට අදාළ ආකල්ප සංවර්ධනය කිරීම.
5. වෘත්තීය ජීවිතය සඳහා ජීවන කුසලතා.
6. රැකියාවක් සඳහා අයදුම්පතක් සකස් කිරීම සහ යොමු කිරීම.
7. සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම
8. ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සහ වෘත්තීය සංක්‍රමණ
9. ප්‍රජා ව්‍යාපෘති සහ ස්වෙච්ඡා වැඩසටහන්

D. නායකත්ව හා පෞරුෂ සංවර්ධනය

1. පුද්ගල හා සමාජ ආචාරශීලී බව
2. පුද්ගල සනීපාරක්ෂාව හා හැඩවැඩ වීම
3. පුද්ගල වගකීම හා යුතුකම්
4. නව යොවුන් වියේ උපදේශන අරමුණු හා එහි වැදගත්කම
5. නව යොවුන් වියේ අවශ්‍යතා හඳුනාගැනීම
6. නව යොවුන් වියේ ලිංගික ගැටලු හා ලිංගාශ්‍රිත රෝග
7. මනෝ ලිංගික ගැටලු සහ නව යෞවනයා
8. යෞවන විය උපදේශනය සහ භාවමය බුද්ධි කළමනාකරණය
9. ස්වීයත්වය / පෞරුෂය
10. නායකත්ව කුසලතා වර්ධනය
11. අන්තර් පුද්ගල සබඳතා වර්ධනය
12. සන්නිවේදන කුසලතා
13. කණ්ඩායම් ගොඩනැගීම
14. ස්වයං අභිප්‍රේරණය
15. ආත්ම සම්ප්‍රජානනය
16. තීරණ ගැනීම හා ගැටුම් කළමනාකරණය
17. ක්ලමතය හා චිත්තවේග
18. පුද්ගල ජීවන දැක්ම

ජීවන කුසලතා ප්‍රධාන විෂයට අමතරව තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි භාෂාව, දෙමළ භාෂාව, සෞන්දර්ය රසාස්වාදය, මූලික අත් ආයුධ පුහුණුව, ශාරීරික යෝග්‍යතා පුහුණුව සහ බැහැරගත පුහුණුව යන අංගවලින් පාඨමාලාව සමන්විත වේ.

එක් එක් පුහුණු මධ්‍යස්ථානයකින් මූලික පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කරන පුහුණුලාභීන් 30 දෙනෙකු බැගින් තෝරාගෙන ඔවුන් වෙත උපරිමය රු. 100,000/= බැගින් පූර්ණ ශිෂ්‍යත්ව ලබාදී වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීමක් සිදුකරනු ලබයි. අනෙකුත් පුහුණුලාභීන් ඔවුන්ගේ අභිමතය පරිදි තෝරාගනු ලබන ගාස්තු රහිත වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම් සිදුකොට ඔවුන්ගේ අනාගත වෘත්තීය ක්ෂේත්‍රයට අවශ්‍ය මූලික අඩිතාලම ලබාදෙනු ලබයි.

මූලික අත්ආයුධ පුහුණුව (C1- C21), වෘත්තීය මාර්ගෝපදේශනය (A 1- A 4, D 1), පෞරුෂ සංවර්ධනය (A5, B1, B2), ඉංග්‍රීසි භාෂාව(D2, D3, D6), තොරතුරු තාක්ෂණය (D4, D5) යන විෂයයන් ඇතුළත් NVQ සඳහා වන කාර්යයන් ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 1 වන මට්ටම ලබා ගැනීම සඳහා අදාළ එම විෂය කොටස් සාර්ථකව නිමකරනු ලබන පුහුණුලාභීන් හට යොවුන් සේනාංක සහතිකයට අමතරව NVQ පළමු මට්ටමේ සහතික පතක් පිරිනමනු ලැබේ.

## පාඨමාලාවට අදාළ විෂයන් සහ එහි කාල පරිච්ඡේද

| විෂය | වර්ෂය 2020 | |
|---|---|---|
| | I කණ්ඩායම (මාස 03) | II කණ්ඩායම (මාස 06) |
| වෘත්තීය මාර්ගෝපදේශනය | 70 | 100 |
| පෞරුෂ සංවර්ධනය | 70 | 100 |
| තොරතුරු තාක්ෂණය | 50 | 160 |
| ඉංග්‍රීසි භාෂාව | 50 | 136 |
| සෞන්දර්ය | 25 | 50 |
| දෙමළ | 25 | 50 |
| මූලික අත් ආයුධ පුහුණුව | 30 | 90 |
| විශේෂ වැඩසටහන් | 118 | |
| බැහැරගත පුහුණුව | 36 | 16 |
| අමතර | 16 | 6 |
| සරඹ | 74 | |
| **මුළු කාල පරිච්ඡේද** | **564** | **708** |



## පුහුණුලාභීන් බඳවා ගැනීම

| 2020 | | | 2020 - I කණ්ඩායම | | | | | | | | | 2020 - II කණ්ඩායම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | පළාත | මධ්‍යස්ථානය | ලියාපදිංචි | | | හැරයාම් | | | විසිරයාම | | | ලියාපදිංචි | | | |
| | | | පි | ගැ | මුළු | පි | ගැ | මුළු | පි | ගැ | මුළු | පි | ගැ | මුළු | කොවිඩ්19 හේතුවෙන් මෙම පාඨමාලාව අවසන් කිරීමට සිදු නොවිය. යොවුන/යොවුනියන් හට 2021 - I කණ්ඩායම සඳහා නැවත සම්බන්ධ වන මෙන් උපදෙස් ලබා දෙන ලදී. |
| 1 | බස්නාහිර | කටුනායක | 143 | 68 | 211 | 31 | 17 | 48 | 112 | 51 | 163 | 21 | 13 | 34 | |
| 2 | | අත්තනගල්ල | 124 | 78 | 202 | 8 | 5 | 13 | 116 | 73 | 189 | 35 | 8 | 43 | |
| 3 | | දිවුලපිටිය | 174 | 84 | 258 | 14 | 7 | 21 | 160 | 77 | 237 | 14 | 14 | 28 | |
| 4 | | බුලත්සිංහල | 173 | 98 | 271 | 17 | 16 | 33 | 156 | 82 | 238 | 30 | 30 | 60 | |
| 5 | | යක්කල | 143 | 78 | 221 | 20 | 6 | 26 | 123 | 72 | 195 | 31 | 16 | 47 | |
| 6 | මධ්‍යම | ගම්පොළ | 123 | 85 | 208 | 11 | 0 | 11 | 112 | 85 | 197 | 27 | 29 | 56 | |
| 7 | | නාඋල | 157 | 94 | 251 | 20 | 11 | 31 | 137 | 83 | 220 | 14 | 11 | 25 | |
| 8 | | නුවරඑළිය | 104 | 120 | 224 | 22 | 49 | 71 | 82 | 71 | 153 | 15 | 21 | 36 | |
| 9 | | හඟුරන්කෙත | 78 | 81 | 159 | 9 | 8 | 17 | 69 | 73 | 142 | 8 | 17 | 25 | |
| 10 | | වලපනේ | 110 | 155 | 265 | 19 | 17 | 36 | 91 | 138 | 229 | 7 | 25 | 32 | |
| 11 | | සෙංකඩගල | 110 | 61 | 171 | 17 | 8 | 25 | 93 | 53 | 146 | 22 | 10 | 32 | |
| 12 | | යටිනුවර | 119 | 70 | 189 | 8 | 5 | 13 | 111 | 65 | 176 | 22 | 26 | 48 | |
| 13 | දකුණ | ගාල්ල | 202 | 106 | 308 | 40 | 12 | 52 | 162 | 94 | 256 | 11 | 10 | 21 | |
| 14 | | නෙළුව | 91 | 78 | 169 | 13 | 5 | 18 | 78 | 73 | 151 | 6 | 13 | 19 | |
| 15 | | අකුරැස්ස | 128 | 120 | 248 | 42 | 36 | 78 | 86 | 84 | 170 | 10 | 7 | 17 | |
| 16 | | වීරකැටිය | 116 | 107 | 223 | 11 | 1 | 12 | 105 | 106 | 211 | 7 | 12 | 19 | |
| 17 | | සූරියවැව | 76 | 93 | 169 | 13 | 7 | 20 | 63 | 86 | 149 | 24 | 2 | 26 | |
| 18 | | අක්මීමන | 124 | 124 | 248 | 29 | 24 | 53 | 95 | 100 | 195 | 10 | 9 | 19 | |
| 19 | | දික්වැල්ල | 123 | 66 | 189 | 45 | 10 | 55 | 78 | 56 | 134 | 19 | 13 | 32 | |
| 20 | | ලුණුගම්වෙහෙර | 65 | 53 | 118 | 12 | 5 | 17 | 53 | 48 | 101 | 5 | 9 | 14 | |
| 21 | | වීරවිල | 81 | 80 | 161 | 5 | 12 | 17 | 76 | 68 | 144 | 8 | 7 | 15 | |
| 22 | වයඹ | කුලියාපිටිය | 143 | 134 | 277 | 30 | 29 | 59 | 113 | 105 | 218 | 11 | 8 | 19 | |
| 23 | | වාරියපොළ | 159 | 153 | 312 | 30 | 18 | 48 | 129 | 135 | 264 | 48 | 23 | 71 | |
| 24 | | මාවතගම | 193 | 145 | 338 | 53 | 17 | 70 | 140 | 128 | 268 | 17 | 15 | 32 | |
| 25 | | පඬුවස්නුවර | 182 | 150 | 332 | 34 | 25 | 59 | 148 | 125 | 273 | 35 | 17 | 52 | |
| 26 | | දොඩම්ගස්ලන්ද | 171 | 93 | 264 | 18 | 9 | 27 | 153 | 84 | 237 | 18 | 16 | 34 | |
| 27 | | නාත්තණ්ඩිය | 78 | 46 | 124 | 15 | 7 | 22 | 63 | 39 | 102 | 7 | 3 | 10 | |
| 28 | | වෙන්නප්පුව | 114 | 111 | 225 | 21 | 17 | 38 | 93 | 94 | 187 | 6 | 11 | 17 | |
| 29 | | අලව්ව | | | | | | | | | | 13 | 33 | 46 | |
| නීති ගාස්තු | | | 20,000 | 7,500 |
| වෙනත් | | | 700,220 | 866,653 |
| බැහැර කිරීම් පාඩු | සටහන් - 18-1 | | 49,514 | (44,527) |
| සභා රැස්වීම් | | | - | 93,000 |
| සංග්‍රහ | | | 798,329 | 979,414 |
| | | | **1,568,063** | **1,902,040** |
| | | | | |
| **සටහන් - 19 ක්ෂය** | | | | |
| ඉඩම්, ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | | | 25,824,770 | 25,336,874 |
| මෝටර් වාහන | | | 5,190,377 | 15,427,293 |
| ලී බඩු හා සවිකිරීම් | | | 26,021,691 | 26,000,153 |
| සංගීත හා ක්‍රීඩා උපකරණ | | | 845,823 | 2,165,754 |
| කාර්යාල උපකරණ | | | 3,886,720 | 3,858,590 |
| විදුලි උපකරණ | | | 1,885,977 | 2,742,595 |
| පරිගණක උපකරණ | | | 43,852,580 | 43,590,009 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | | | 10,648,744 | 10,652,744 |
| ඉගෙනුම් උපකරණ | | | 6,187,348 | 7,992,500 |
| | | | **124,344,030** | **137,766,513** |
| | | | | |
| **සටහන් - 20 කාර්ය මණ්ඩල පුහුණු කිරීම්** | | | | |
| ධාරිතාව වර්ධනය - පුහුණුකරුවන්ගේ පුහුණු වැඩසටහන | | | 1,199,495 | 616,915 |
| පුහුණු ධාරිතාව ගොඩනැගීම | | | 279,910 | 15,000.00 |
| | | | **1,479,405** | **631,915** |
| | | | | |
| **සටහන් - 21 තොග බැහැර කිරීමේ පිරිවැය** | | | | |
| **තොග බැහැර කිරීමේ පිරිවැය** | | | 1,583,903 | 3,521,848.39 |
| | | | **1,583,903** | **3,521,848.39** |
| | | | | |
| **සටහන් - 22 පුහුණුලාභී දීමනා** | | | | |
| පුහුණුලාභී දීමනා | | | 43,749,900 | 69,026,992 |
| ආහාර දීමනා | | | 70,765,634 | 117,645,278 |
| | | | **114,515,534** | **186,672,270** |

NYC විසින් 2020 වසර සඳහා 13,396 පුහුණුකරුවන් පුහුණු කර ඇත.

| | | | 2020 | 2019 සංශෝධිත |
|---|---|---|---|---|
| සටහන් - 23 තරුණ සංවර්ධන වැඩසටහන් | | | | |
| වෘත්තීය පුහුණු දීමනා | | | 1,818,400 | 4,300,600 |
| විසිරයාමේ පෙළපාලි | | | - | 5,482,280 |
| බැහැරගත පුහුණු පාඨමාලා පැවැත්වීම | | | 5,046,968 | 7,846,727 |
| | | | **6,865,368** | **17,629,607** |

වසර තුළ මෘදු නිපුණතා සංවර්ධන මූලික පාඨමාලාවෙන් සමත් වූ මුළු අභ්‍යාසලාභීන් ගණන 9,629 කි. NYC අභ්‍යන්තර අභ්‍යාසලාභීන් 5,001 ක් සහ වැඩසටහන් 3ක් පුහුණු කිරීම සඳහා ABT වැඩසටහන් 18ක් පවත්වා ඇත.

| | | | 2020 | 2019 සංශෝධිත |
|---|---|---|---|---|
| සටහන් - 24 තරුණයින් පුහුණු කිරීමේ වැඩසටහන් | | | | |
| ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම් කිරීම | | | 13,409 | 432,539 |
| නායකත්ව පුහුණු වැඩසටහන් | | | 727,843 | 170,480 |
| ක්‍රීඩා උලෙළ | | | 127,539 | 2,531,670 |
| දැනුම මිනුම වැඩසටහන් | | | - | 4,664,283 |
| කළා උලෙළ | | | 22,800 | - |
| දෙමාපිය දින වැඩසටහන් | | | - | 2,025,326 |
| මධ්‍යස්ථාන කළා උලෙළ | | | - | 1,127,539 |
| බෝවන රෝග නිවාරණ වැඩස-ටහන | | | 1,000 | - |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | | | 144,675 | 22,647 |
| බෝ නොවන රෝග නිවාරණ වැඩසටසන | | | 6,940 | 15,077 |
| ශ්‍රී ලංකා පරිසරය ආරක්ෂණය කිරීමේ වැඩසටහන | | | - | 2,990 |
| එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩස-ටහන වැඩසටහන | | | - | 880 |
| සුහද හමුව | | | - | 4,000 |
| සහතික පත්‍ර ප්‍රධානෝත්සවය | | | - | 65,389 |
| සමාරම්භක උත්සවය | | | - | 195,636 |
| ප්‍රජා වැඩසටහන | | | - | 500 |
| ආපදා කළමණාකරණය | | | 19,793 | 35,950 |
| ආපදා කළමනාකරණ වැඩස-ටහන | | | - | 944,626 |
| බහුකාර්ය පුහුණු කිරීමේ වැඩසටහන | | | 1,202,333 | |
| පුහුණුලාභී සුහද හමුව | | | - | 278,396 |
| ජාතික සංහිඳියාව | | | - | 5,850 |
| | | | | |
| | | | **2,266,332** | **12,523,776** |
| | | | | |

**එක් එක් තරුණ පුහුණු වැඩසටහනේ භෞතික ප්‍රගතිය අංක 24 - 1 සටහනේ දැක්වේ.**

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **සටහන් - 25 පුහුණුලාභීන් බඳවා ගැනීම හා ප්‍රචාරණය** | | | | |
| ප්‍රචාරණය | | | 5,341,726 | 5,159,057 |
| බඳවාගැනීම් | | | 1,386,963 | 10,905,408 |
| | | | **6,728,689** | **16,064,464** |
| | | | | |
| | | | **2020** | **2019 සංශෝධිත** |
| **සටහන් -18 - 1 වත්කම් බැහැර කිරීමේ අලාභය/ (ලාභ)** | | | | |
| **වත්කම් බැහැර කිරීමේ පිරිවැය** | | | 3,448,312 | 2,800,760 |
| | | | **3,448,312** | **2,800,760** |
| බැහැර කල වත්කම් වල ක්ෂය වෙන් කිරීම් | | | (3,153,068) | (2,062,388) |
| වර්ෂය සඳහා වත්කම් විකුණුම් ආදායම | | | (245,730) | (782,900) |
| බැහැර කිරීමේ අලාභය/ (ලාභ) | | | **49,514** | **(44,527)** |

**සටහන් 24 - 1 තරුණ පුහුණු වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | වියදම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම් කිරීම | 13,409 | 5 | 48 |
| නායකත්ව පුහුණු වැඩසටහන් | 727,843 | 30 | 2,162 |
| ක්‍රීඩා උළෙල | 127,539 | 18 | 2,464 |
| කළා උළෙල | 22,800 | | |
| ලිංගිකව බෝවන රෝග නිවාරණ වැඩසටහන | 1,000 | 94 | 8,964 |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන | 144,675 | 1 | 27 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | - | 91 | 8,414 |
| බෝ නොවන රෝග නිවාරණ වැඩස-ටසන | 6,940 | 89 | 8,528 |
| ශ්‍රී ලංකා පරිසරය ආරක්ෂණය කිරීමේ වැඩසටහන | - | 23 | 2,522 |
| ප්‍රජා වැඩසටහන | - | 67 | 4,710 |
| ආපදා කළමණාකරණ වැඩසටහන | 19,793 | 67 | 7,620 |
| බහුකාර්ය පුහුණු කිරීමේ වැඩසටහන | 1,202,333 | 403 | 20,104 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## සැකසීමේ පදනම

- මූල්‍ය ප්‍රකාශන වරලත් ගණකාධිකරණ ආයතනය මඟින් නිකුත් කර ඇති රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම මත සකස් කර ඇත.
- ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබේ.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනෙන් පසු එළැඹි කරුණු

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කළ දිනට පසුව ගිණුම්වල සිදුවන සැලකිය යුතු වෙනස්වීම් පිළිබඳ අවශ්‍ය ගැලපුම් සිදුකරනු ඇත.

## වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

- ජාතික යොවුන් සේනාංකය 2002 අංක 21 දරණ යොවුන් සේනාංක පනත යටතේ ක්‍රියාත්මක වන අතර දැනට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතී.
- ජාතික යොවුන් සේනාංකය 2015 වර්ෂයේ සිට ගිණුම් ප්‍රකාශ සකස් කරනු ලැබේ. ජාතික යොවුන් සේනාංක සභාවේ. නිර්දේශ මත ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් අනුමත කරන ලද මණ්ඩලයක් මඟින් සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත.
- ජාතික යොවුන් සේනාංකය භාවිත කරනු ලබන ගොඩනැගිලි අයිතිය ජාතික යොවුන් සේනාංකය සතුව නොමැති බැවින් එම ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොමැත. 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරනු ලැබූ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් තුළ කරනු ලැබූ ගොඩනැගිලි ඉදිකිරීම් වියදම 5% වාර්ෂික ක්ෂය අනුපාතය යටතේ ක්ෂය කරන ලදී. ජාතික යොවුන් සේනාංකයේ ත්‍රිරෝධ රථ හැර අනෙකුත් සංචිත වාහන ද ජාතික යොවුන් සේනාංක අයිතිය යටතේ නොමැති වුවත් සියලුම වාහන 20% ක්ෂය අනුපාතය යටතේ ක්ෂය කර ඇත.
- පසුකාලීන පිරිවැය වත්කමෙහි ධාරණ අගයෙහි එකතුවක් ලෙස හෝ වත්කම ලෙස හඳුනාගනු ලබන්නේ එම වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභය ආයතනය වෙත ලැබෙන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් පමණි. අනෙකුත් සියලු අලුත්වැඩියා සහ නඩත්තු වියදම් එම වියදම් කරනු ලබන වර්ෂයට අදාළව කාර්ය සඳහා වර්ෂයෙහි වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

## ක්ෂය කිරීම්

සරල මාර්ග ක්‍රමය යටතේ වත්කමෙහි ජීව කාලය තුළ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත ක්ෂය කිරීම් කරනු ලැබේ. වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය කරනු ලබන අතර වත්කම් ඉවත් කරනු ලබන වර්ෂයේදී ක්ෂය කිරීම් නොකරනු ලැබේ.

## ක්ෂය කිරීමේ අනුපාත

| | |
|---|---|
| ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් | 5% |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 20% |
| මෝටර් වාහන | 20% |
| ලීබඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පුහුණු උපකරණ | 20% |
| පරිගණක හා උපාංග | 20% |
| විදුලි උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 12.5% |

### තොග අගය කිරීම්

තොග අගය කිරීම් කරනු ලබන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය යටතේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වේ.

### වගකීම් සහ වෙන්කිරීම්

හඳුනාගත් සියලු වගකීම් ගිණුම්හි ඇතුළත් කර ඇති අතර ඇති විය හැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකර ඇත.

### පාරිතෝෂික වෙන් කිරීම්

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදුකරනු ලැබේ. ජාතික යොවුන් සේනාංකය වෙනුවෙන් වසර 05 හෝ ඊට වැඩි වසර ගණනක් සේවය කළ සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම් හිමිකම ලැබේ.

### විලම්බිත ආදායම් (Deferred Income)

ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්හි ආයුකාලය තුළ ක්‍රමාණුකූල පදනමක් යටතේ කාර්ය සාධන වාර්තාවෙහි විලම්බිත ආදායම් ලෙස දක්වනු ලැබේ.

# විගණකාධිපති වාර්තා



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SYA/A/NYC/01/20/14 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date: 2022 අගෝස්තු 17 දින |

25 AUG 2 22

සභාපති,
ජාතික යොවුන් සේනාංකය.

ජාතික යොවුන් සේනාංකයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්: 1. ලේකම් - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SYA/A/NYC/1/20/14

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 අගෝස්තු 17 දින

සභාපති
ජාතික යොවුන් සේනාංකය

**ජාතික යොවුන් සේනාංකයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික යොවුන් සේනාංකයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින සේනාංකයට අයත් පිරිවැය රු.432,263,958 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 03 ප්‍රකාරව ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 93 වන වගන්තිය අනුව අස්තිත්වයක් විසින්, රේඛීය අයිමතවල වැඩිදුර උපවර්ගීකරණයක් ඉදිරිපත් කරන විට, අස්තිත්වයේ මෙහෙයුම් වලට උචිත ආකාරයට ඒවා වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන මුහුණතෙහි හෝ සටහන්වල ඉදිරිපත් කළ යුතු වුවද සේනාංකයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති රු.2,236,026,793 ක් වූ කෙරිගෙන යන වැඩ සඳහා විස්තරාත්මක සටහනක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව අනාගත සේවක වැටුප් වැඩිවීම, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් පාරිතෝෂිත වෙන්කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු වුවත් ජාතික යොවුන් සේනාංකය විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවකයින් 404 ක් සඳහා පාරිතෝෂිත ලෙස රු. 37,083,980 ක් වෙන්කර තිබුණද ඒ සඳහා පශ්චාත් පාරිතෝෂිත වෙන්කිරීම් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඊ) ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු වුවද සේනාංකය විසින් ආදායම්, වියදම්, රාජ්‍ය ප්‍රදාන ලැබීම්, කෙටිකාලීන ආයෝජන, ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණු රු.1,077,517,669 ක් පිරිවැය වූ පුහුණු මධ්‍යස්ථාන 15 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට 2020 දෙසැම්බර් 31 දින වන විටත් කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ භාවිතයට ගෙන තිබුණු රු.682,875,647 ක් පිරිවැය වූ පුහුණු මධ්‍යස්ථාන 09 ක් සඳහා වාර්ෂික ක්ෂය වියදම රු.34,143,782 ක්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) 2019 වර්ෂයේ දී සේවයෙන් ඉවත් වූ කාර්ය මණ්ඩලයේ 37 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණු රු.3,604,183 ක පාරිතෝෂිත මුදල පෙර වර්ෂ ගැලපීමක් ලෙස සමුච්චිත ඌණතාවයට ගලපනු වෙනුවට 2020 වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් 2020 වර්ෂයේ අතිරික්තය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවීම් කරන ලද නමුත් 2021 වර්ෂයට අදාළ රු.2,187,544 ක් වූ වියදම් අයිතම 10 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා අතිරික්තය පිළිවෙලින් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සේනාංකයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික යොවුන් සේනාංකයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සේනාංකයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික යොවුන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සේනාංකය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) සහ (ඇ) ඡේදවල සඳහන් කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සේනාංකයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සේනාංකය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ජාතික යොවුන් සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.1 ඡේදය | සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සේනාංකය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සේනාංකය විසින් නියමිත දිනට මාස 09 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික යොවුන් සේනාංකයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික යොවුන් සේනාංකයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

-----------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ වල දක්වා ඇති සේනාංකයෙන් පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2015 සිට 2020 දක්වා පරිහරණය කරන ලද විදුලිය හා ජල පරිභෝජනයට අදාළව හා වරිපනම් වෙනුවෙන් අයවිය යුතුව පැවති රු.13,144,155 ක් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 25 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 සිට 2019 වර්ෂය දක්වා කාල සීමාවට අදාළ නිරවුල් නොකළ එකතුව රු.59,901,715 ක් වූ ගෙවිය යුතු ශේෂයන් 19 ක් නිරවුල් කිරීමට හෝ තවදුරටත් වගකීමක් නොමැතිනම් මූල්‍ය ප්‍රකාශනවල නැවත ගැලපුම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික යොවුන් සේනාංකයේ ප්‍රධාන කාර්යාලයේ භාවිතා වන ලියාපදිංචි අයිතිය වෙනත් අමාත්‍යාංශ හා ආයතන සතු වටිනාකම රු.29,050,000 ක් වන වාහන 07 ක් මෙතෙක් සේනාංකය නමින් පවරාගෙන නොතිබුණු අතර සේනාංකය විසින් 2020 දෙසැම්බර් 31 දිනට පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ඉඩම් සංඛ්‍යාව 64 ක් වන අතර එම ඉඩම් අතරින් ඉඩම් 19 ක් පමණක් සේනාංකයට පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 45 හි පවරා ගැනීම් කටයුතු මෙතෙක් නිම වී නොතිබුණි

(ඈ) 2020 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් වැඩ අවසන් කරන ලද පුහුණු මධ්‍යස්ථාන 03 ක්, ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කරන ලද පුහුණු මධ්‍යස්ථාන 04 ක් හා මූලික ප්‍රමාණපත් වල අඩුපාඩු පැවතීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා ඇති පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට ලබා දී තිබූ එකතුව රු.73,300,221 ක් වූ ඉදිකිරීම් අත්තිකාරම් මේ වන විටත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය (NEMO) වෙත ජාතික යොවුන් සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක් හා පවතින මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ලබාදී තිබුණි. අදාළ ඉදිකිරීම් ප්‍රගතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2020 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තු අවලංගු කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවත් ජාතික යොවුන් සේනාංකය විසින් NEMO ආයතනය වෙත 2016 හා 2017 වර්ෂ වලදී ලබාදී තිබුණු රු.109,234,674 ක් වූ මුළු අත්තිකාරම් මුදලින් රු.43,856,413 ක් මෙම ඉදිකිරීම් කටයුතු අවලංගු කර වසර දෙකක් ගත වී තිබියදීත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සේනාංකයේ පොෂ්‍ය මට්ටමේ අනුමත තනතුරු 18 කින් තනතුරු 05 ක් පුරප්පාඩු වී පැවතුණි. තවද අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ සංවර්ධන සහකාර හා කළමනාකාර සහකාර තනතුරු සඳහා පිළිවෙළින් 122 ක් හා 28 ක් බැගින් පුරප්පාඩු පැවතුණි. කොන්ත්‍රාත් පදනම මත අනුමත තනතුරු 297 ක් පැවති අතර එයින් මධ්‍යස්ථානාධිපති, සහකාර මධ්‍යස්ථානාධිපති, සහකාර අධ්‍යක්ෂ සහ සරඹ උපදේශක යන තනතුරු වලට අයත් පුරප්පාඩු 57 ක් පැවතුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තා පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ

මගේ අංකය/எனது இல/ My No. : YC/5/10/Audit
දිනය/ திகதி/ Date: 2022/05/
ඔබේ අංකය/உமது இல/ Your No. : SYA/A/NYC/1/20/14

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72
පොල්දූව පාර, බත්තරමුල්ල.

<u>**ජාතික යොවුන් සේනාංකයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**</u>

1. මූල්‍ය ප්‍රකාශන
1.1 මතය
1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම
(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැර වීම

(i) 2021 වර්ෂයේ ගිණුම් මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ කෙරීගෙන යන වැඩ හි විස්තරාත්මක සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව පෙන්වා දෙමි.

(ii) ජාතික යොවුන් සේනාංකයේ පාරිතෝෂිත ගෙවීම් ගණනය කිරීම සඳහා මෙතෙක් පශ්චාත් පාරිතෝෂිත වෙන් කිරීම් ප්‍රතිපත්තියක් සකස් කර නොමැති බව පිළිගන්නා අතර, ඉදිරියේදී එම ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(iii) මුදල් ප්‍රවාහන ප්‍රකාශයන්හි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා ඇති නොනිමි වැඩ අත්පත් කර ගැනීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ලෙස 2021 වර්ෂයේ වාර්ෂික ගිණුම්හි නිවැරදි කරන ලදී.

(iv) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පූර්ණ වශයෙන් ක්ෂය වී ඇති වත්කම් සියල්ලම නැවත අගය කිරීමට සැලසුම් සිදු කරන ලදී. නමුත් කෙටි කාලයක් තුල අදාල වත්කම් සියල්ලම අගය කිරීමට නොහැකි බැවින්, විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම සමඟ සාකච්ඡා කර සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති සංගීත භාණ්ඩ සහ ක්‍රීඩා භාණ්ඩ පමණක් 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශනයේ අදාල ගැලපුම් වශයෙන් සිදු කරන ලදී.
ඉතිරි වත්කම් ක්ෂය ගණනය කිරීම ඉදිරි වර්ෂය තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(v) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හා 92 (ආ) ඡේදයේ ප්‍රකාරව අදාල හෙළිදරව්ව සිදු කර ඇත.

(vi) දේපල පිරියත හා උපකරණ සටහන තුළ ඇතුලත් සංගීත භාණ්ඩ හා ක්‍රීඩා භාණ්ඩ සියයට 20 ක ප්‍රතිශතයකින් ක්ෂය කර තිබුණු අතර, එම ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කර නොතිබුණු බව දක්වා ඇත. එලෙස සිදු කර ඇත්තේ සංගීත භාණ්ඩ හා ක්‍රීඩා භාණ්ඩ යනාදිය පුහුණු උපකරණ යටතට ගනිමින්ය. විමසුම මඟින් එම කරුණ පෙන්වා දීමත් සමඟ 2021 වර්ෂයේ මූල්‍ය වාර්තා තුල නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර ඇත.

(vii) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මෙම ගිණුම් කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

(ආ) පුහුණුලාභීන් සඳහා නිකුත් කරනු ලබන විසිරයුමේ නිළ ඇඳුම්, නිදන මළු, මෙට්ට සහ ඇඳ ඇතිරිලි නැවත නැවත පරිභෝජනයට යොදා ගන්නා අයිතමයන් කිහිපයකි. එහෙයින් මෙම උපකරණ පාරිභෝජන ද්‍රව්‍ය බැවින් මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වත්කම් ලෙස දක්වා ඇති බව සඳහන් කරමි.

එසේම Training Kit ලෙස යොදා ගැනෙන උපකරණ කට්ටලද නැවත නැවත පුහුණුලාභීන් සඳහා නිකුත් කරමින් පරිහරණය කරන බැවින් එම උපකරණද ජංගම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇත.

(ඇ) පෙන්වා දී ඇති මධ්‍යස්ථාන 11 න් වැඩ අවසන් කල මධ්‍යස්ථාන 05 ක අවසන් ගෙවීම් 2021 වර්ෂයේ සිදු කර ඇති බැවින් එම වියදම් ප්‍රාග්ධනිත කිරීම් 2021 වර්ෂයේ ගිණුම් වලදී සිදු කර ඇත. මොනරාගල හා ගම්පොල මධ්‍යස්ථානයන්වල ගෙවීම් හි පවතින ගැටළු හේතු කොටගෙන අදාල වියදම් මේ වන තෙක් ප්‍රාග්ධනිත කර නොමැත. අනෙකුත් මධ්‍යස්ථානයන්ට අදාල (සියඹලාණ්ඩුව, වැල්ලවාය, තණමල්විල) ඉදිකිරීම් සඳහා 2021 වර්ෂයේ සියළු ගැලපුම් සිදු කර ඇත.

(ඈ) මෙම ඉදිකිරීම් වලට අදාල ක්ෂය ගැලපුම් 2021 වාර්ෂික ගිණුම්හි සිදු කර ඇති බව පෙන්වා දෙමි.

(ඉ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ සිදු කරන ලද සියලුම ඉදිකිරීම් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අවලංගු කරන ලදී. මේ වන විට තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, දෙහිඅත්තකණ්ඩිය යන ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන වල ඉදිකිරීම් අවසන් කර තිබුණද, අවසන් ගෙවීම් කටයුතු නිරවුල් කර නොතිබුණි. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ සිදුකල ඉදිකිරීම්හි ගෙවීම් කටයුතු සිදු කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවත් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හා ජාතික යොවුන් සේනාංකය සමඟ සම්බන්ධයෙන් මෙම වසර තුළ නිම කිරීමට කටයුතු කරනු ඇත.

(ඊ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂිත වියදම රු.3,177,303 ක් වැඩියෙන් දක්වා තිබූ වරද 2021 වර්ෂයේ වාර්ෂික ගිණුම්හි නිවැරදි කර ඇත.

(උ) 2020 වර්ෂය සඳහා පාරිතෝෂිත වෙන් කිරීම් ප්‍රකාශයෙහි සේවකයින් 6 දෙනෙක් සඳහා වෙන් නොකරන ලද පාරිතෝෂිත වියදම 2021 වර්ෂයේ ගිණුම් තුල ඇතුලත් කර ඇත.

(ඌ) 2019 වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම ගණනය කිරීමේදී මූලික වැටුප සඳහා පමණක් පාරිතෝෂික වෙන් කිරීම සිදු කර ඇත. එහෙත් ඒ සඳහා වූ ජීවන වියදම් දීමනාව එකතු කර ගණනය කිරීම සිදු නොවී ඇත. මේ වන විට එම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත. 2020 වර්ෂයේ ඉවත් වූ සේවකයින් 07 සඳහා පාරිතෝෂික වෙන් කිරීමේදී ද ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන ගණනය කිරීම සිදු වී ඇත. අදාල සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීමේදී එම වරද නිවැරදි කර ගෙවීම් සිදු කර ඇත.

පාරිතෝෂික ගෙවීමේ කාල සීමාව වරදවා දැක්වීම කොන්ත්‍රාත් පදනමින් සේවය කල සේවකයින් කිහිප දෙනෙකු ස්ථිර පත්වීම් ලබා ඇති අතර ස්ථිර පත්වීම් ලබා ගැනීමේදී සේවා කාලය අඛන්ඩව සිදු නොවී ඇත. එහිදී එම සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීමේදී කොන්ත්‍රාත් කාල සීමාව පමණක් පදනම් කර ගෙවීම් සිදු කර ඇත.

(එ) 2019 වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීමේ ශේෂය ගණනය කිරීමේදී අතපසු වීමකින් සේවකයින් 37 ක් සඳහා වෙන් කර නොතිබූ ප්‍රමාණය සහ 2020 වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීම් ශේෂය හා පාරිතෝෂිත වියදම වැඩියෙන් දක්වා තිබීමේ වරද 2021 වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීමේ ප්‍රකාශය සකස් කිරීමේදී නිවැරදි කරන ලදී.

(ඒ) 2020 වර්ෂයේදී සේවයෙන් ඉවත් වූ එම සේවකයින් සඳහා ගෙවිය යුතු පාරිතෝෂිත මුදල් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී ජංගම වගකීම් යටතේ හඳුනා ගන්නා ලදී.

(ඓ) 2019 වර්ෂයේ සේවයෙන් ඉවත් වූ සේවක අංක 2357 යන අයගේ සේවා කාලය කොන්ත්‍රාත් පදනමේ සිට ස්ථිර පත්වීම ලබා ගැනීමේදී සේවා කාලය අඛණ්ඩව සිදු නොවීම මත ගෙවීම් සිදු නොවූ අතර සේවක අංක 3096 සඳහන් සේවිකාව සේවයෙන් ඉවත් වීමක් සිදු කර එම ඉවත් වීමෙන් මාසයක කාලයකට පසු නැවත සේවයට එක් වීමක් සිදු කර ඇත. එහිදී සේවා කාලය අඛණ්ඩව සිදු නොවීම හේතුවෙන් එම ගෙවීම් සිදු කර නොමැත.

(ඔ) ඇඹිලිපිටිය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 2016 වර්ෂයේ අවසන් කලද එම ඉදිකිරීම් වලට අදාල සියළු ගෙවීම් 2019 වර්ෂයේ සිදු කර ඇති අතර, එම වියදම් ප්‍රාග්ධනිත කිරීම සහ අදාල ක්ෂය ගැලපුම් 2021 වර්ෂයේ සිදු කර ඇත.

(ඕ) 2019 වර්ෂයට අදාල මෙම වියදම් ගිණුම් අංශය වෙත ලැබීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් 2020 වර්ෂය තුල මෙම ගෙවීම් සිදු කර ඇති බව පිළිගනිමි. එහෙත් ඉදිරි වර්ෂ වලදී මෙවැනි අතපසුවීම සිදු නොවීමට කටයුතු සිදු කරනා බව සඳහන් කරමි. 2021 වර්ෂයට අදාල ගනුදෙනු 10 ක් 2020 වර්ෂය තුළ දරා ඇති බවත් ඒ අනුව අම වටිනාකම් අධිතක්සේරු වී ඇති බවත් විමසුම මඟින් පෙන්වා ඇත. මෙලෙස සිදු වී ඇති බෙහොමයක් ගනුදෙනු බොහොමයක් ඒ ඒ ආයතනයන් සමඟ වසරක කාල සීමාවක් සඳහා ගිවිසුම් අත්සන් කිරීමත් සමඟ ඇති කර ගත් බැඳීම් බව පෙන්වා දෙමි.

එහෙත් 2021 වර්ෂයේ වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී මෙම කරුණ නිවැරදි කරමින්, ගිණුම් සකස් කිරීම සිදු වී ඇති බව සඳහන් කරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1

2.1.1

2.2

2.2.1

2.2.2

| නීතිරීති / විධානයට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) 5.4.8 වගන්තිය | | |
| (ආ) | | |
| (i) | චක්‍රලේඛයේ 8.3.9 | 2020 වර්ෂය ආවරණය වන පරිදි ක්‍රමෝපායන් ඇතුලත් සංයුක්ත සැලැස්මක් ජාතික යොවුන් සේනාංකය සඳහා පිළියෙල විධායක කමිටුව සඳහා ඉදිරිපත් කර අනුමැතියක් ලබා ගෙන නොමැති බව පිළිගනිමි. එහෙත් ඒ වන විටත් සැලැසුම් කර තිබූ ජාතික යොවුන් සේනාංක අධිකාරි පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනත් සමඟ ඒ හා සමගාමීව ඇතුලත් විය යුතු කරුණු සඳහන් කරමින් සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පැවතිණ.<br><br>ඒ අනුව 2023 – 2027 වර්ෂයන් සඳහා වූ විධිමත් සංයුක්ත සැලැස්මක් සම්පාදනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කර අවසන්ව ඇත. |
| (ii) | චක්‍රලේඛයේ 6.5.1 | ජාතික යොවුන් සේනාංකය අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් ඉවත් වී ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පත්වීමත් සමඟ ස්වාධීනව වාර්ෂික ගිණුම් සකස් කිරීම සිදු කල යුතු විය. ඒ අනුව 2015 වර්ෂයේ ප්‍රථම වරට ගිණුම් සකස් කිරීම 2016 වර්ෂයේ අවසන් භාගයේ සිට ක්‍රියාත්මක විය. ඒ අනුව 2015 වර්ෂය සඳහා වන ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම 2017 වර්ෂයේදී සිදු වූ බව පිළිගනිමි.<br><br>එසේම එම ගිණුම් වාර්තාව සකස් කර අවසන් වූ සැනින් 2016 වර්ෂික ගිණුම් සකස් කිරීමද සිදු කල යුතු විය. ඒ අනුව 2015 හා 2016 වර්ෂයන්හි ගිණුම් සකස් කිරීම සම කාලීනව සිදු විය. |

2017 හා 2018 වර්ෂයන් සඳහා වන වර්ෂික ගිණුම් නිසි කාල සීමාව තුල සකස් කිරීම අවසන් කල නමුත්, වරින් වර දේශපාලනික වෙනස් වීම් සමඟ ජාතික යොවුන් සේනාංක සභාවේ වෙනස්කම් සිදු විය. එම වෙනස් වීම් මත සකස් කර අවසන් වී ඇති ගිණුම් ජාතික යොවුන් සේනාංක සභාවෙන් අනුමත කර ගැනීමට නොහැකි වීම ගැටලු සහගත විය. එලෙස සකස් කරන ලද 2018 වර්ෂයට අදාල වාර්ෂික ගිණුම් ජාතික යොවුන් සේනාංක සභාවේ අනුමැතිය සඳහා 2019 වර්ෂයේ ඉදිරිපත් කරන ලද අතර, 2019/08/07 වන දින රැස්වූ සභාව විසින් එම ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය අත්සන් යොදා ඇත්තේ වගන්තියකට යටත්වයි.

එහෙයින් එම ගිණුම් වාර්තාව පිළිගත නොහැකි බව විගණන අංශය වෙතින් දන්වා ඇති අතර, 2020 වර්ෂය පුරාවට යොවුන් සේනාංක සභාවක් රැස් නොවූ බැවින්, නැවත වරක් 2018 වර්ෂයේ ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 2021 වර්ෂයේ මාර්තු මස 10 වන දිනය. සකස් කරන ලද 2019 වාර්ෂික ගිණුම් වාර්තාව 2021 වර්ෂයේ මාර්තු මස 26 වන දින සභා අනුමැතිය ලැබී ඇත.

එලෙස පසුගිය වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන අනුමත කර ගැනීමට සිදු වූ ප්‍රමාදය මෙන්ම ඒ වන විට කොවිඩ් 19 උවදුර වැනි ස්වාභාවික තත්වයන් හේතුවෙන් රටතුළ පැනවූ නිරෝධායන ඇඳිරිනීතිය වැනි තත්වයන් හේතුවෙන් 2020 වර්ෂයට අදාල වාර්ෂික ගිණුම් සකස් කර අවසන් කිරීම ජුනි මස දක්වා ප්‍රමාද වූ බව පිළිගනිමි. එම තත්වයන් යටතේ සකස් කර ගත් 2020 වාර්ෂික ගිණුම් වාර්තාව සඳහා 2021/10/27 වන දින සභා අනුමැතිය ලද පසු 2021/11/25 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද බව පැහැදිලි කරමි.

2.2.3

2.2.4

(අ) වාහන කළමණාකරණය

යොවුන් සේනාංක ප්‍රධාන කාර්යාලය විසින් පරිහරණය කරනු ලද LK 6091 ලොරි රථය, PD 9016, PE 0914 හා GC 4505 අංක දරණ රථ වල ලියාපදිංචි අයිතිය යොවුන් සේනාංකය වෙත පවරා ගැනීමට අවශ්‍ය අනුමැතිය අදාල ආයතන වෙතින් මේ වන විට ලබා දී ඇති අතර, ඊට අනුව ඉදිරි කටයුතු කරමින් පවතී.

(ආ) කළමණාකරණ අකර්යක්ෂමතා

යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන18 ක් පිහිටුවා ඇති ඉඩම් පවරා ගැනීම් මේ වන විට අවසන් කර ඇති අතර තවත් ඉඩම් 04 ක් පවරා ගැනීමට අදාළව පළාත් ඉඩම් කොමාසාරිස්වරුන් විසින් නිර්දේශ කර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. එමෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩම් 02 ක් පවරා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අත්පත් යෝජනා අනුව පවරාදීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් සෘජුවම යොවුන් සේනාංකය වෙත පවරා දීමක් සිදු නොකරන අතර එම ඉඩම් පවරා දෙනු ලබන්නේ යොවුන් සේනාංකය අයත් රේඛීය අමාත්‍යාංශය වෙත වේ. ඒ අනුව පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉතිරි ඉඩම් පවරා ගැනීමේ කටයුතුද යොවුන් සේනාංකය අයත් රේඛීය අමාත්‍යාංශය සමඟ සම්බන්ධතාවයෙන් සිදු කරමින් පවතී. කෙසේ වුවද ඒ ඒ ප්‍රාදේශීය ලේකම්වරුන් හා අදාළ ආයතන ලබා දෙන සහයෝගයත්, ඉඩම් වල නිරවුල්භාවය පිලිබඳව පවතින යම් යම් ගැටළු හේතුවෙන් මෙම පවරා ගැනීම් අවසන් කර ගැනීම ප්‍රමාදවී ඇත.

(ඇ) අමාත්‍ය මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක නොවීම

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ සිදු කරන ලද සියලුම ඉදිකිරීම් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අවලංගු කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව 50% අඩු ව්‍යාපෘති යලි ටෙන්ඩර් කිරීමට තීරණය කර තිබුණද නැවත 2021.08.25 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1586/340/031 මඟින් 50% අඩු ව්‍යාපෘති උප කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමීමට අනුමැතිය ලබා දී ඇත. මේ සඳහා 2021 හා 2022 වර්ෂ වල ප්‍රතිපාදන නොලද හෙයින් ඉදිරි වසරේ ප්‍රතිපාදන තුළින් උප කොන්ත්‍රාත් කරුවන්ට පිරිනැමීමට කටයුතු කරනු ඇත.

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ සිදු කරන ලද සියළුම ඉදිකිරීම් අවලංගු කිරීමෙන් පසු තවදුරටත් ජාතික යොවුන් සේනාංකය වෙත අයවිය යුතු අත්තිකාරම් මුදල් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| **නිරවුල් කර ගත යුතුව ඇති අත්තිකාරම් මුදල** | **- රු:109,234,674.36** |
| යොවුන් සේනාංකය වෙත රඳවාගෙන තිබූ බිල්පත් වටිනාකම | - රු: 25,407,498.36 |
| බිල්පත් ගෙවීමේදී රඳවාගෙන ඇති මුදල | - රු: 39,970,762.92 |
| **ඒ අනුව රඳවාගෙන ඇති මුළු මුදල** | **- රු: 65,378,261.28** |

ඒ අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදලින් තවදුරටත් ජාතික යොවුන් සේනාංකය වෙත නිරවුල් කර ගත යුතු මුදල වන රු:109,234,674.30 ක මුදල ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ගෙවීමට ඇති (රඳවාගෙන ඇති) මුදල වන රු: 65,378,261.28 ක

මුදලින් අඩුකර  අය කර ගත යුතු ඉතිරි මුදල වන රු: 43,856413.08 ක මුදල ඉදිරියේදී අවසන් බිල්පත් නිරවුල් කිරිමේදී අය කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ඈ) ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ

(i) විමසුම මඟින් පෙන්වා දී ඇති 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු පැරණි ශේෂයන් වන රුපියල් 59,901,715 ක මුදලට අදාල සියලුම බැඳීම් මේ වන විට නිරවුල් කරමින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදිව දක්වා ඇත.

(ii) අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් තුල රඳවා ගැනීම් සඳහා ඉදිරිපත් කල උපලේඛණයේ රු 7,526,423 ක් වූ හර ශේෂයන් 18 ක් පැවැති බවත් එම අගය ගෙවිය යුතු වටිනාකම් වලින් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති බව සඳහන් කර ඇත. මෙම  හර ශේෂයන් සබැඳිව නිවැරදි හඳුනා ගැනීම සහ එය නිවැරදි කරමින් 2021 වාර්ෂික මූල්‍ය වාර්තා තුල නිවැරදි කර ඇති බව පෙන්වා දෙමි.

(iii) අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් සඳහා විගණන වෙත ලබා දුන් උපලේඛණයෙහි පද්ධති වැරදි ලෙස හඳුනා ගෙන ඇති හර සහ බැර ශේෂයන් නිවැරදිව හඳුනා ගනිමින් 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දක්වා ඇති බව සඳහන් කරමි.

(iv) එම ආයතනය වෙතින් 2021 වර්ෂයට අදාලව වියදම් වෙනුවෙන් ගෙවීම් මේ වන විට සිදු කර ඇත. එසේම පසුගිය වර්ෂයන් සඳහා වූ වියදම් ගෙවීම් කිරීමට ප්‍රතිපාදන එම ආයතනය සතු නොවන බව දන්වා ඇති අතර, එම කරුණ විගණන හා කලමණාකරණ කමිටු රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදී.  කමිටුව විසින් ලබා දුන් උපදෙස් අනුව එම කරුණ ජාතික යොවුන් සේනාංක සභාව වෙත ඉදිරිපත් කර  ඒ අනුව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඉ) ලැබිය යුතු අත්තිකාරම් ශේෂ

(i) පහත සඳහන් ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන සඳහා ලබා දුන් අත්තිකාරම් මුදල් අවසන් බිල්පත් සකස් කිරීමේදී අඩු කර ගෙවීම් සඳහා ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමි.

| අනු අංකය | මධ්‍යස්ථානයේ නම | අත්තිකාරම් ලබා දුන් දිනය | 2020.12.31 දිනට ශේෂය (රු.) | වැඩ අවසන් කළ දිනය |
|---|---|---|---|---|
| 1 | බලංගොඩ | 2017.06.10 | 2,150,914.00 | 2019.09.29 |
| 2 | දෙහිඕවිට | 2017.06.10 | 4,060,062.00 | 2019.12.06 |
| 3 | මැදිරිගිරිය | 2017.06.10 | 2,463,529.00 | 2019.01.06 |

(ii)

| මධ්‍යස්ථානයේ නම | අත්තිකාරම් ලබා දුන් දිනය | **2020.12.31** දිනට අත්තිකාරම් ශේෂය | **2022 02.17** දිනට අත්තිකාරම් ශේෂය | ඉදිකිරීම් ගිවිසුම් අවලංගු කිරීමට හේතුව | **2022.03.03** දිනට තත්ත්වය |
|---|---|---|---|---|---|
| වැලිමඩ | 2017.04.10 | 19,259,019.78 | 19,259,019.78 | සුදුසු ඉඩමක් නොමැතිවීම. | වැලිමඩ හා මීගහකිවුල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයන්හි කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර ඇති අතර මෙම ඉදිකිරීම් නැවත ආරම්භ නොකරනු ඇත. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති බිල්පත් ගෙවීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර නොමැති අතර ඒ සඳහා නිරවුල් කරුවෙකු (Adjutucator) වෙත ඉදිරිපත් කර ඇත. එහෙත් ඊට එකඟ නොවූ කොන්ත්‍රාත්කරු මෙම කාර්යය බේරුම්කරුණ සඳහා (Arbitration) වෙත ඉදිරිපත් කර ඇත. |
| මීගහකිවුල | 2017.02.10 | 19,662,001.35 | 19,662,001.35 | මධ්‍යස්ථානය ඉදිකිරීමට ලබා දී ඇති ඉඩම ඒ සඳහා සුදුසු නොවීම | |
| පැල්මඩුල්ල | 2017.06.10 | 17,018,460.81 | 17,018,460.81 | සුදුසු ඉඩමක් නොමැතිවීම. | පැල්මඩුල්ල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවලංගු කර ඇති අතර නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකරනු ඇත.අදාළ කොන්ත්‍රාත්කරු දඹුල්ල (දිගම්පතන) ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන බැවින් පැල්මඩුල්ල ජාතික යොවුන් සේනාංකයේ අත්තිකාරම් මුදල් එමඟින් අයකර ගැනීමට කටයුතු කරනු ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් එකඟත්වය පල කර ඇත. |
| කොටපොළ | 2017.06.10 | 17313228.47 | 6985089.43 | කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම්වල මන්දගාමී ප්‍රගතිය | කොටපොළ ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වල මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කල නිසා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත ගිවිසුම අවලංගු කර ඇත. ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්තානය විසින් ඉදිකිරීම් කටයුතු සිදුනොකරන අතර ගෙවීමට ඇති ඉතිරි අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. එහෙත් එම කාර්යය මේ වන තෙක් සිදු නොවී ඇති බැවින්, එම කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය ලිපි මේ වන විට නිකුත් කර ඇත. |

(iii) ගෝමරන්කඩවල පෙර සවි ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සම්බන්ධයෙන් අවසන් නිගමනයකට පැමිණි පසු කඩිනමින් ඉතිරි අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලබයි.

(iv) 2016 අගෝස්තු 09 දිනැති අංක 16/1501/736/034 දරන කැබිනට් අනුමැතිය මඟින් NEMO ආයතනය වෙත ජාතික යොවුන් සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක් හා පවතින මධ්‍යස්ථාන වල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත පිරිනමා ඇත. එහෙත් අදාළ ආයතනය විසින් ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් 2020 වර්ෂයේදී සියළු ඉදිකිරීම් අවලංගු කරන ලදී. මෙම ඉදිකිරීම් අවලංගු කරන දින වන විට nemo ආයතනයට ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු:109,234,674.36 ක මුදලක් තව දුරටත් අයකර ගතව තිබුණි. ඉන් ඒ වන විට ජාතික යන්ත්‍රෝපකරණ ආයතන විසින් රඳවා ඇති මුදල් සහ ගෙවීමට තිබී බිල්පත් වලින් රු:65,378,261.28 ක මුදලක් ඉහත අය වීමට තිබූ රු:109,234,674.36 ක මුදලින් නිරවුල් කර ඇති අතර තව දුරටත් නිරවුල් විය යුතු රු:43,856,413. ක් වන අත්තිකාරම් මුදල ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සමඟ අවසන් ගිණුම් කටයුතු සිදු කිරීමේදී කඩිනමින් නිරවුල් කරනු ඇත.

**2.3 වෙනත් කරුණු**

(i) ජාතික යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයේ 2020 වර්ෂයේදී පුරප්පාඩු සංඛ්‍යාව 324 ක්ව පැවතීමට බලපෑ ප්‍රධානතම හේතුවක් ලෙස ද්විතියික මට්ටමේ සේවක පුරප්පාඩු 259 ක් පැවතීම දැක්විය හැක.

මෙම ද්විතියික මට්ටම මඟින් නිරූපණය වන්නේ සංවර්ධන සහකාර හා උපදේශක (තොරතුරු තාක්‍ෂණ, ඉංග්‍රීසි, දෙමළ භාෂා) යන සේවකයන්ය. මෙම නිලධාරීන් බොහොමයක් උපාධිධාරීන් වන බැවින් විශේෂයෙන්ම උපාධිධාරීන් සඳහා රජය විසින් පත්වීම් ලබා දෙන අවස්ථාවලදී මෙන්ම ගුරු සේවයට බඳවා ගැනීමේදී මෙම සේවයෙන් ඉවත්වීමේ ප්‍රවණතාවය ඉහළ අගයක් ගනී. එසේම රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවකයින්ට හිමි වන වරප්‍රසාද හා පහසුකම් යොවුන් සේනාංක කාර්ය මණ්ඩලයට හිමි නොවන බැවින් එවැනි ආයතනය තනතුරක පත්වීමට අවස්ථාව ලැබෙන යොවුන් සේනාංක සේවකයින් යොවුන් සේනාංක සේවයෙන් ඉවත්වීමට නිරන්තරයෙන් සිදු වේ. 2020 වර්ෂය තුලද උපාධිධාරී පත්වීම් ලබා දුන් බැවින්, යොවුන් සේනාංකයේ සිටි උපදේශකවරුන් සැලකිය යුතු ප්‍රමාණයක් සේවයෙන් ඉවත් වූ නිසා මෙම පුරප්පාඩුව දැක ගත හැකි විය.

(ii) ජාතික යොවුන් සේනාංකය විසින් Excel මෘදුකාංගයක් අධාරයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන යන ලදී. 2016 – 2018 වර්ෂයන් තුල නියමු ව්‍යාපෘතිය යටතේ ස්ථාවර වත්කම් විශාල ප්‍රමාණයක් මිලදී ගැනීම හේතුකොට ගෙන එම ලේඛණය යාවත්කාලීන කිරීමේදී ප්‍රායෝගික ගැටලු රැසක් මතු විය.

ඒ අනුව විමසුම මඟින් පෙන්වා ඇති යාවත්කාලීන නොවූ ස්ථාවර වත්කම් ලේඛණය, 2021 වර්ෂය තුල සිදු වූ වත්කම් නැවත අගය කිරීමත් සමඟ ඊට අනුව යාවත්කාලීන කර ගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

**කර්නල් දර්ශන රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී**

සභාපති/අධ්‍යක්ෂ